# කාර්ය සාධන වාර්තාව

# 2013

## පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| | ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය | 01- 02 |
| | ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | 03 |
| | ලේකම්තුමාගේ පණිවුඩය | 04 |
| 1. | අමාත්‍යාංශයේ දැක්ම | 05 |
| 2. | අමාත්‍යාංශයේ මෙහෙවර | |
| 3. | අමාත්‍යාංශයේ අරමුණු | 06 |
| 4. | අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර | 07 - 08 |
| 5. | මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර | 09 |
| 6. | පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල | 10 - 11 |
| 7. | අමාත්‍යාංශයේ මූලික කාර්යභාරය | 12 - 13 |
| 8. | පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුළ අත්කර ගත් ජයග්‍රහණ | 14 - 15 |
| 9. | කාර්ය සාධනය - 2013 | 16 - 43 |
| 10. | ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති | 44 - 45 |
| 11. | ව්‍යාපෘති මාලාව | 46 - 57 |
| 12. | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ( SLILG) | 58 - 61 |
| 13. | දේශීය ණය සහ සංවර්ධන අරමුදල ( LLDF) | 62 - 66 |



# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

"ගම ශක්තිමත් කිරීම තුළින් රට ශක්තිමත් කරමු" යන තේමාව යටතේ ගම දියුණු කරමින් රටේ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම තුළින් සංවර්ධනයේ විප්ලවීය වෙනසක් සිදු වී ඇති බව කැපී පෙනෙන යථාර්ථයක් වී ඇත. ඒ අනුව පළාත් පාලන ක්ෂේත්‍රයේද සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින් පළාත් පාලන ආයතන (ඡන්ද විමසීම්) පනත් කෙටුම්පත හා පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2012.10.10 දින පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මත වීම රජයත් මාගේ අමාත්‍යාංශයත් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් බව ඉතා සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි. මේ වන විට පළාත් පාලන බල ප්‍රදේශ සඳහා නව කොට්ඨාශ සීමා නිර්ණය කිරීමේ කටයුතුද ඉතාමත් සාර්ථක අයුරින් අවසන් අදියරට එළඹ ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "මහින්ද චින්තන සංවර්ධන වැඩපිළිවෙළ" අනුව පළාත් පාලන ක්ෂේත්‍රය තුළ "යහ පාලනය" ස්ථාපිත කොට රටේ සංවර්ධන ක්‍රියාදාමය වඩාත් අර්ථවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා මාගේ අමාත්‍යාංශයත්, ඒ යටතේ ඇති පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයත් විශේෂ වැඩසටහන් දියත් කර ඇති බව සඳහන් කරමි. එමෙන්ම ආදායම් තත්ත්වයෙන් පහල මට්ටමක පවත්නා තෝරාගත් පසුගාමී පළාත් පාලන ආයතන සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් පළාත් පාලන බල ප්‍රදේශ වල ආර්ථික සංවර්ධනය උදෙසා අවශ්‍ය යටිතල පහසුකම් බොහොමයක් ලබා දීමෙන්ද රට පෙරට යොමු කිරීමේ ක්‍රියාදාමයට දායකත්වය දී ඇත. එමෙන්ම දශක තුනකට ආසන්න කාලයක් පැවති කුරිරු යුද්ධයෙන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටි උතුරු සහ නැගෙනහිර පළාත් පාලන ආයතන යළි ශක්තිමත් කර මහජන නියෝජිතයින් මගින් ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා අවස්ථාව සලසා දීමටද පියවර ගනිමින් සිටීම වැදගත් කොට සලකමි.

තවද "පුරනැගුම" ව්‍යාපෘතිය මගින් දිවයිනේ පිහිටි අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන සියයකට වැඩි ප්‍රමාණයක් තෝරාගෙන ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර දී ඇත. ඒ තුළින් සැළසුම් සහගත කුඩා නගර නිර්මාණය කිරීම හා දියුණු කිරීම අරමුණ වී ඇත. තවද මා විසින් මෙම අමාත්‍යාංශය භාරගත් පසුව, පළාත් පාලන ආයතනයන්වල බොහෝ කලක් තිස්සේ ප්‍රධාන අඩුපාඩුවක්ව පැවති රථ වාහන හා

සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ ඌනතාවයන්ට ස්ථිර විසඳුම් ලබා දීමේ අරමුණින් රථවාහන සහ යන්ත්‍රෝපකරණ පළාත් පාලන ආයතන විශාල සංඛ්‍යාවකට ලබා දී ඇත. එසේම පළාත් පාලන ආයතනවලට අභියෝගයක්ව පවතින කසල කළමනාකරණ වැඩපිළිවෙල විධිමත්ව හා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා උපකාර ලෙස ඊට අවශ්‍ය මූල්‍ය පහසුකම් මෙන්ම යන්ත්‍රෝපකරණ හා වාහන ලබාදීම සඳහාද මාගේ අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

තවද දිවයිනේ පිහිටි පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යන හදිසි ආපදා කළමණාකරන වැඩපිළිවෙල ශක්තිමත් කිරීම සඳහා ඊට අවශ්‍ය වාහන හා යන්ත්‍රෝපකරණ ලබාදීමේ වැඩපිළිවෙල ද ක්‍රියාත්මක කර ඇත. එලෙසම සියළුම පළාත් පාලන බල ප්‍රදේශවල ස්වභාවික සම්පත් හා පරිසරය නිසි ලෙස සංරක්ෂණය කරමින් පවත්වාගෙන යෑමට අවශ්‍ය මාර්ගෝපදේශ හා උපදෙස් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ තුළින් පළාත් පාලන ආයතන වල නිසි ආදායම් ජනනය වීම අපේක්ෂා කෙරේ.

ලෝක බැංකුව (World Bank), ආසියානු සංවර්ධන බැංකු (ADB), හා ජයිකා (JICA) යන ණය ආධාර ක්‍රියාත්මක ව්‍යාපෘති මගින් උතුර, නැගෙනහිර, ඌව, මධ්‍යම සබරගමුව, උතුරු මැද යන පළාත්වල පිහිටි මාර්ග ඉදි කරීම්, වැඩි දියුණු කිරීම් සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති විශාල ප්‍රමාණයක්ද දැනට සාර්ථකව නිම වෙමින් පවතී. එලෙසම ලෝක බැංකු (World Bank) ණය ආධාර මත ක්‍රියාත්මක දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) මගින් දිවයිනේ සියලුම පළාත් සභාවලට අයත් පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඉලක්ක කරගෙන ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු මෙන්ම ගුරු පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාමේ කටයුතුද සාර්ථකව ක්‍රියාත්මක වේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නිවැරදි මඟ පෙන්වීම සහ මාගේ අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍ය ඉන්දික බණ්ඩාරනායක මැතිතුමාගේ ද, ලේකම් ආර්.ඒ.ඒ.කේ. රණවක මහතාගේ සහ කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරින්ගෙන් ලද නොමසුරු සහයෝගය ද මම බෙහෙවින් අගය කොට සළකන අතර, මෙම වසරේ මෙන්ම පසුගිය වසර කිහිපය තුළ පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ ලබාගත් ජයග්‍රහණ වෙනුවෙන් දැක්වූ දායකත්වය සඳහා සියළුම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ලා, පළාත් ගරු ප්‍රධාන ඇමතිතුමන්ලා ඇතුළු ගරු පළාත් අමාත්‍යවරු, ගරු පළාත් සභා මන්ත්‍රීවරු ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත්, ගරු නගරාධිපතිතුමන්ලා හා නගර සභා ගරු සභාපතිතුමන්ලා, ප්‍රදේශිය සභා ගරු සභාපතිතුමන්ලා ඇතුළු පළාත් පාලන ආයතනවල සියලුම මහජන නියෝජිතයින්ට හා එහි කාර්ය මණ්ඩලවලටත් මගේ කෘතඥතාවය පුදකරනුයේ ඉතාමත් සතුටිනි.

**ඒ.එල්.එම්. අතාඋල්ලා (පා.ම)**
**පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය**



# ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය

මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්ති වැඩපිළිවෙල යථාර්ථයක් බවට පත් කරමින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය සංවර්ධනයේ ප්‍රතිලාභ සෑම පළාතකටම තුලනාත්මකව ලබාදීමටත් දිවයිනේ සියලුම පලාත් පාලන ආයතන ස්වයංව ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ නගා සිටුවීමටත් විශේෂ වැඩපිළිවෙල රාශියක් ක්‍රියාත්මක කර ඇත.

අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 අයවැය යෝජනා ඉදිරිපත් කරමින් අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා පළාත්වල දිළිඳුකම අඩු කිරීමට සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කළ විශේෂ වැඩපිළිවෙල මෙම අමාත්‍යාංශය මගින් ආරම්භ කර ක්‍රියාවට නංවා ඇත. තවද, එම වැඩපිළිවෙල ශක්තිමත් කිරීමට පුර නැගුම, කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන වැඩසටහන ඉමහත් දායකත්වයක් සපයන අතර, පළාත් පාලන ක්ෂේත්‍රය වඩාත් මහජන හිතකාමී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමටද කටයුතු කර ඇත.

එමෙන්ම, පළාත් පාලන අණපනත් සංශෝධනය කරමින් සංවර්ධනයට හිතකර වටපිටාවක් සමස්ථ දිවයිනේම පළාත් පාලන ආයතන හරහා නිර්මාණය කරවීමට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය බෙහෙවින් කැපවී ඇති අතර ඒ පිළිබඳව මම අගය කරමි.

ගරු පළාත් පාලන සහ පළාත් සභා ඇමතිතුමාට, අමාත්‍යාංශ ලේකම්වරයාට මෙන්ම මෙම සංවර්ධන වාර්තාවේ සටහන් වන අප අමාත්‍යාංශයේ කාර්යසාධනයේ ලා දායක වූ අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ටද මාගේ අවංක ස්තූතිය පළ කරමි.

**ඉන්දික බණ්ඩාරනායක (පා.ම)**
**පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍ය**



# ලේකම්තුමාගේ පණිවුඩය

මහින්ද චින්තන - ඉදිරි දැක්ම ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් ආසියාවේ මෙන්ම ලෝකයේ වේගයෙන් සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාව කඩිනම් සංවර්ධන මාවතකට අවතීර්ණ වී ඇත.

ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍රය තුළ දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින පංච බල කේන්ද්‍රීය සංවර්ධන වැඩසටහන් හැරුණු කොට, පළාත් හා ප්‍රාදේශීය වශයෙන්ද, නාගරික හා ග්‍රාමීය වශයෙන්ද, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය, පළාත් සභා සහ මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා සමග ඉටු කරනු ලබන කාර්යභාරය අතිමහත්ය.

පළාත් පාලන මට්ටමින් සිදු කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය වේගවත්වීම තුළ පොදු මහජනයා හට සේවා සම්පාදනය කිරීමේදී වඩාත් මහජන හිතකාමී පරිසරයක් ගොඩනැගීම සඳහා කටයුතු කිරීමට විශේෂ අවධානයක් යොමු කර ඇත. මේ අතර, පළාත් පාලන ආයතන කාර්යාල පරිශ්‍ර මහජන මිත්‍රශීලී පරිසරයක් ඇති හොඳ සේවා මධ්‍යස්ථාන බවට පත් කිරීමටත්, දැකුම්කළු, ප්‍රියමනාප සහ පිරිසිදු කුඩා නගර ලෙස, තෝරාගත් නගර සංවර්ධනය කිරීම සඳහා වූ පුරනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත්, ඒ යටතේ කුඩා නගරවල පහසු ප්‍රවේශ මාර්ග, සතිපොළ, පුස්තකාල, ළමා උද්‍යාන, වැසිකිළි, රථ ගාල්, ගිමන්හල් ආදී පහසුකම් ඇති කිරීමටත්, කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, එමෙන්ම කොළඹ නගරය තුළ ශත වර්ෂයක් පමණ පැරණි මළ අපද්‍රව්‍ය හා අප ජලය බැහැර කිරීමටත්, අන්තර් මාර්ග සංවර්ධනය කිරීමටත් කටයුතු කිරීම හා මේ සියළුම සංවර්ධන කාර්යයන් සඳහා යෙදී සිටින දේශපාලන නායකත්වය හා නිලධාරීන් දැනුවත් කරමින් ආකල්ප වර්ධනය කිරීමටත් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය කටයුතු කරමින් සිටියි.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය සමග 2013 අයවැය ප්‍රකාශනයේ අඩංගු යෝජනාද මගින් සංවර්ධන වැඩසටහන් නිර්මාණය කොට ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති මග පෙන්වීමත්, ගරු ඇමතිතුමාගේ හා නියෝජ්‍ය ඇමතිතුමාගේ මෙහෙයවීමත්, කාර්ය මණ්ඩලයේ හා පළාත් පාලන හා පළාත් සභා ක්‍රියාකාරි ආයතනයන්ගේ දායකත්වයත් මේ මොහොතේ ගෞරවයෙන් යුක්තව සිහිපත් කරමි.

**ආර්.ඒ.ඒ.කේ.රණවක**
**ලේකම්**
**පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය**

1

## අමාත්‍යාංශයේ දැක්ම

*බලය බෙදාහැරීම, විමධ්‍යගතකරණය සහ සහභාගීත්ව පාලන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමෙහි ලා කටයුතු කරන ප්‍රමුඛ හා ප්‍රශස්ථ ආයතනය බවට පත් වීම.*

2

## අමාත්‍යාංශයේ මෙහෙවර

*ජනතා අභිලාශයන් සඵල කරවන අන්දමේ කාර්යක්ෂම හා ඵලදායී පළාත් සභා සහ පළාත් පාලන ක්‍රමයක් තහවුරු කිරීම සහ විමධ්‍යගත පාලන ව්‍යුහය සවිමත් කිරීමත් දිරිගැන්වීමත් මඟින් ශ්‍රී ලංකාව තුළ සමතුලිත සහ තිරසාර මානව සංවර්ධනයක් උදාකර ගැනීම සඳහා පහසුකම් සම්පාදනය.*

# 3

# අමාත්‍යාංශයේ අරමුණු

- මධ්‍යම රජය සහ පළාත් සභා අතර සම්බන්ධීකරණය.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය.
- ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට සහාය වීම.
- මූල්‍ය, තාක්ෂණික හා නෛතික සහාය ලබාදීම සහ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- අන්තර්ජාතික සබඳතා පවත්වාගෙන යාම සහ විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පළාත් පාලන මැතිවරණ පිළිබඳව ජාතික මට්ටමේ වගකීම.
- ඵලදායී විමධ්‍යගත පාලනයක් නියාමනය කිරීම.
- භෞතික, ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වර්ධනයට සහාය වීම.

# 4

# අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛ ක්ෂේත්‍ර

**01.** පළාත් පාලනයට අදාල ජාතික නීති වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කිරීම

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත සම්මත කිරීම
- මහනගර සභා ආඥා පනත සංශෝධනය කිරීම
- නගර සභා ආඥා පනත සංශෝධනය කිරීම
- ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම
- පළාත් පාලන පරිපාලනය, පිරිස් පාලනය, ආදායම් වලට අදාළ නීති සකස් කිරීම
- මහජන සෞඛ්‍යයට හා පරිසරයට අදාළ නීති සකස් කිරීම
- පොදු උපයෝගිතා සේවා පිළිබඳ නීති සකස් කිරීම

**02. පළාත් සභා සහ පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රශස්ත පාලනයක් සඳහා අවශ්‍ය සහය ලබා දීම**

- දැනුවත් කිරීම හා පුහුණු කිරීම
- කාර්යය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම
- නීති කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව ප්‍රවර්ධනය
- පළාත් පාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- පලාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම

**03. පළාත් පාලන ආයතනවල සේවා සැපයීම කාර්යක්ෂම කිරීම**

- ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය
- පරිගණක ආශ්‍රිත සේවා සැපයීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- මළාපවාහන පද්ධති කළමනාකරණය
- පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, වාහන අවශ්‍යතා සපුරා ගැනීමට සහය වීම

## 04. පළාත් සභා සඳහා සහාය සේවා සම්පාදනය කිරීම

- පළාත් සභාවලට අවශ්‍ය පුනරාවර්තන වියදම් නිදහස් කිරීම
- පළාත් සභාවල වියදම් විමංසනය කිරීම

## 05. සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම

- ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා දේශීය හා විදේශ ආයෝජන යෙදවීමට කටයුතු කිරීම
- ප්‍රාදේශීය මාර්ග, සෞඛ්‍ය , අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම
- කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් පළාත් පාලන ආයතන නංවාලීම

# 5

# මහින්ද චින්තන ඉදිරි දැක්ම තුල පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට අදාළ ක්ෂේත්‍ර

- ගම්මානවල ජන ඝනත්වය පදනම් කරගෙන සුදුසු ප්‍රදේශවල ග්‍රාමීය ජලසම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ( පි.අ. 67)
- රෝහල් සඳහා කේන්ද්‍රික අප ජලය බැහැර කිරීමේ පද්ධති ලබා දීම. ( පි.අ. 67)
- ප්‍රාදේශීය කේන්ද්‍රස්ථාන හඳුනා ගැනීම සඳහා නව මාවත් ගොඩනැගීම ( පි.අ. 97)
- පුළුල් කලයුතු මාර්ග හඳුනා ගැනීම සහ වැඩි දියුණු කිරීම ( පි.අ. 97)
- මාර්ග නඩත්තු කිරීමේ කළමනාකරණ පද්ධතියක් යොදා ගැනීම ( පි.අ. 97)
- අත්‍යාවශ්‍ය මංසන්ධි හඳුනාගෙන රථවාහන කළමනාකරණ ක්‍රම සහ පදික පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරෙනු ඇත ( පි.අ. 98)
- ත්‍රීරෝද රථ ගාල් සැපයීම ( පි.අ. 106)
- නව පදික මාවත් හා බයිසිකල් සඳහා මාවත් ඉදිකිරීම ( පි.අ. 108)
- නගර සභා හා මහ නගර සභාවල අපද්‍රව්‍ය කළමණාකරණ පහසුකම් සහ ජල සම්පාදනය ( පි.අ. 163)
- පොදු ස්ථාන හා සේවාවන් වෙත පහසු ප්‍රවේශය සඳහා පහසුකම් වැඩිකිරීම හා නියාමය කිරීම ( පි.අ. 194)
- විනෝද උද්‍යාන හා ඇවිදීමේ පථයන් පිහිටුවීම ( පි.අ. 194)
- පළාත් සභාවල සහ ප්‍රාදේශීය සභාවල කාන්තා නියෝජනය ඉහළ නැංවීම (පි.අ.194)

*** ඉහත දක්වා ඇත්තේ මහින්ද චින්තන ඉදිරි දැක්ම පිටු අංකයන් වේ.**

# 6

# පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ඇති විවිධ අංශ හා ව්‍යවස්ථාපිත මණ්ඩල

පළාත් පාලන හා පළාත් සභා ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලතාව දැක්වීම වඩාත් පහසුකරලීම සඳහා අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇති විවිධ අංශ හා ආයතන.

- පළාත් පාලන හා පළාත් සභා ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය
- පළාත් පාලන හා පළාත් සභා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය
- අමාත්‍යාංශ ලේකම් කාර්යාලය
- පාලන අංශය
- මුදල් අංශය
- පළාත් පාලන අංශය
  - පළාත් පාලන ප්‍රතිසංස්කරණ ඒකකය
  - පළාත් පාලන පැමිණිලි හා තොරතුරු ඒකකය
- පළාත් සභා හා පුහුණු අංශය
- සංවර්ධන හා සැලසුම් අංශය
  - අඩු අදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ ඒකකය
  - මෙහෙයුම් ඒකකය
  - කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන ඒකකය
  - විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය
  - දැයට කිරුළ සංවර්ධන ඒකකය
  - මාධ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය

- ප්‍රතිපත්ති හා නීති අංශය
- ජාතික අප ද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
    - ➢ ඩෙංගු මර්ධන ඒකකය
- වියදම් විමංසන අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල

පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ ජාතික පුහුණු ආයතනය වන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එසේම දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කළමනාකරණ කටයුතු ද මෙම අමාත්‍යාංශය මඟින් ඉටුකරන සුවිශේෂී කාර්යයකි.

# 7

# අමාත්‍යාංශයේ මූලික කාර්යභාරය

රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය, පළාත් පාලන හා පළාත් සභා ආයතන තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීම, විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය.

## 01.ප්‍රධාන පළාත් සභා ක්‍රියාකාරකම්

- පළාත් සභා 9 සහ පළාත් පාලන ආයතන 335 වෙත සහාය සේවා සම්පාදනය.
- පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආධාර ව්‍යාපෘති සඳහා විධායක ආයතනය වශයෙන් කටයුතු කිරීම.
- දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට මඟ පෙන්වීම හා සහාය ලබාදීම.
- ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය තුළින් පළාත් පාලන ආයතනවලට අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම.
- පළාත් සභාවලට ප්‍රතිපාදන නිදහස් කිරීම හා වියදම් විමංසනය.
- විදේශ ණය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
- නැගෙනහිර හා උතුරු පළාත්වල පාලන කටයුතු ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

## 02. ප්‍රධාන පළාත් පාලන ක්‍රියාකාරකම්

- යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය කිරීමට හා යහපාලනය ප්‍රවර්ධනය කිරීමට පළාත් පාලන ආයතනවලට සහාය දැක්වීම.
- පසුගාමී පළාත් පාලන ආයතනවලට විශේෂ සංවර්ධන සහායන් ලබාදීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල විධිමත්ව හා ශක්තිමත්ව කිරීමට සහාය දැක්වීම.

- පළාත් පාලන ව්‍යවස්ථා සංශෝධනය කිරීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම.
- පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීම හා නව පළාත් පාලන ආයතන ස්ථාපනය කිරීම.
- ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරිම, ආපදා කළමනාකරණය සඳහා පෙර සූදානම සහ ආයතනික හැකියා ප්‍රවර්ධනය.
- උතුරු හා නැගෙනහිර පළාත්වල පළාත් පාලන පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහාය වීම.
- “පුර නැගුම” වැඩසටහන ආරම්භ කිරීම සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ලෙස අවසන් කිරීම.
- කසළ කළමනාකරණය , මලාපවාහන පද්ධතිය නවීකරණය.
- යන්ත්‍ර සූත්‍ර , ගලිබවුසර්, ජල බවුසර් වැනි පහසුකම් සැලසීම.

# 8

# පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුළ අත්කර ගත් ජයග්‍රහණ

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනත සම්මත කර ගැනීම.
- අලුතින් හඳුන්වා දුන් නව මැතිවරණ ක්‍රමයට ඉදිරි පළාත් පාලන මැතිවරණ පැවැත්වීම සඳහා කොට්ඨාශ සීමා නිර්ණය ජාතික කමිටුව සහ දිස්ත්‍රික් කමිටු සීමා නිර්ණය, ජාතික කමිටුව, සහ දිස්ත්‍රික් කමිටු සංස්ථාපනය කිරීම සහ එහි වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම.
- පළාත් සභා ප්‍රඥප්ති සම්පාදනය කිරීම සඳහා හැකියා වර්ධනය කිරීම.
- මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීමට අවශ්‍ය මූලික කෙටුම්පත් සැකසීම.
- රුපියල් මිලියන 10 කට වඩා අඩු වාර්ෂික ආදායමක් ලැබෙන පළාත් පාලන ආයතන 110ක සමාජ ආර්ථික යටිතල පහසුකම් වර්ධනය කිරීමට අවශ්‍ය මූලික සහාය ලබා දීමට පළමු පියවර ආරම්භ කිරීම.
- සෑම පළාතකම ප්‍රදේශ ඉලක්ක කරගත් දිළිඳු බව අඩු කිරීමේ වැඩසටහන් හඳුනාගෙන සහශ්‍ර සංවර්ධන ඉලක්ක වලින් ඔබ්බට ගමන් කිරීමට එම පළාත්වල සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධනය සඳහා නගර 108ක පුරනැගුම ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- පළාත් පාලන ආයතන සතු කේන්ද්‍රීය ග්‍රාමීය මාර්ග හඳුනා ගැනීම සහ මාර්ග ලේඛනය පිළියෙල කිරීම මගින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමට ආයෝජන සැලැස්මක් සකස් කිරීම හා ඒ පිළිබඳ දැනුවත් කිරීම.

- නැගෙනහිර, උතුරුමැද, සබරගමුව, මධ්‍යම, ඌව හා උතුරු පළාත් වල පළාත් මාර්ග කි.මී. 1070 ක් සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද විදේශ ණය ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
- 2013 වසර තුළ පළාත් පාලන ආයතන සඳහා ඩබල් කැබ්රථ, රෝද හතරේ ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර, ට්‍රක් මවුන්ටඩ් ජල බවුසර්, ට්‍රැක්ටර් මවුන්ටඩ් ජල බවුසර්, ටිපර් රථ බෙදාදෙන ලද අතර මීට අමතරව කොළඹ මහ නගර සභාව සඳහා ගලි බවුසර්, සේවක ප්‍රවාහන ට්‍රක් රථ සහ ජංගම දොඹකර බෙදා දෙන ලදී.
- සියළුම පළාත් පාලන ආයතන බල ප්‍රදේශ වල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ඉතාමත්ම ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගෙන පළාත් පාලන ආයතන වල අවශ්‍යතා අනුව සකස් කරන ලද ක්‍රියාත්මක වැඩපිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
- ඩෙංගු මර්ධනය කිරීම ජාතික අවශ්‍යතාවයක් ලෙස සළකා ඒ සඳහා ක්‍රියා කිරීමට අමාත්‍යාංශය යටතේ ඩෙංගු මර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම.
- පළාත් පාලන ආයතන වල සභිකයන් සහ නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පළාත් පාලන ආයතන අතර කළමනාකරණ තරඟය හා පළාත් පාලනය පිළිබඳ ජාතික මහ සමුළුව පැවැත්වීම මගින් පළාත් පාලන සේවාවල ඵලදායීතාවය ඉහළ දැමීම.
- 2013 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය හ සංවර්ධන වැඩසටහන යටතේ අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමළය හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල පළාත් පාලන ආයතන 16 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- 2013 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය හා සංවර්ධන වැඩසටහනේ 7 වන ස්ථානය ලබා ගැනීම.
- දැනට පවත්නා නීති ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා ආදී නෛතික ප්‍රතිපාදනයන් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කර වැඩිදියුණු කිරීම සඳහා ජාතික මට්ටමින් ලබාදිය හැකි සහාය හා පහසුකම් සැලසීමට මෙම අමාත්‍යාංශය ප්‍රමුඛත්වයෙහිලා ක්‍රියාකර ඇත.

# 9

# කාර්යසාධනය - 2013

## 9.1 පළාත් පාලන අංශය

### 9.1.1 අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ වැඩසටහන

මෙම වර්ෂයේදී පළාත් 5ක් තුළ පැවති අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන 19ක් තෝරාගෙන විධිමත් පරිදි මහජන සේවා සැලසීමට හැකිවන අයුරින්, එම පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ඉදි කිරීම්, උපකරණ ලබා දීම සහ වෙනත් යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 40 ක් වෙන්කර තිබූ අතර 2013.12.31 දිනට රු.මිලියන 37.47 ක් වැය කරමින් පහත සඳහන් පරිදි අදාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

| අනු අංකය | ව්‍යාපෘතිය | පළාත් පාලන ආයතන | යෙදවූ මුදල (රු.මි) |
|---|---|---|---|
| 1 | කාර්යාල උපකරණ හා ලිබඩු මිලදී ගැනීම | ගලෙන්බිඳුණුවැව ප්‍රා.ස, හොරොව්පතාන ප්‍රා.ස, වීරකැටිය ප්‍රා.ස, හම්බන්තොට ම.න.ස, මීගහකිවුල ප්‍රා.ස, අක්කරෙයිපත්තු ම.න.ස | 9.27 |
| 2 | ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | මැදිරිගිරිය ප්‍රා.ස, බඩල්කුඹුර ප්‍රා.ස, මඩුල්ල ප්‍රා.ස, පොල්පිතිගම ප්‍රා.ස, නින්දවූර් ප්‍රා.ස, අක්කරෙයිපත්තු ම.න.ස | 24.67 |
| 3 | පෙර පාසැල් ඌනතා අවම කිරීම | පඩුවස්නුවර ප්‍රා.ස, උඩුබද්දාව ප්‍රා.ස, ඉබ්බාගමුව ප්‍රා.ස | 1.66 |
| 4 | ජල ටැංකි, වීදි පහන් ආදී පොදු උපයෝගිතා සේවා | නා උල ප්‍රා.ස, මහියංගන ප්‍රා.ස, ගම්පහ ප්‍රා.ස | 1.87 |
| **යෙදවූ මුදල** | | | **37.47** |
| **මූල්‍ය ප්‍රගතිය** | | | **94%** |

## 9.1.2 පළාත් පාලන ආයතන සතු වාහන අලුත්වැඩියා කිරීම

වඩාත් ඵලදායී මහජන සේවාවන් කාර්යක්ෂමව සැපයීම අරමුණුකොට පළාත් 05ක් තුල අදාල පළාත් පාලන ආයතන 17 ක වසර 10කට වඩා පැරණි ඉතාමත් අබලන් තත්වයේ පවතින ඩබල් කැබ් රථ 17ක් අලුත්වැඩියා කිරීම සඳහා 2013 වසර තුළදී කටයුතු කර ඇත. මේ සඳහා වෙන් කල මුදල රුපියල් මිලියන 20ක් වන අතර වියදම් කල මුදල රුපියල් මිලියන 13.6 කි.


| අනු අංකය | පළාත් පාලන ආයතනය | යෙදවූ මුදල රු.මිලියන |
|---|---|---|
| 1 | රාජාංගනය ප්‍රාදේශීය සභාව | 0.45 |
| 2 | නොච්චියාගම ප්‍රාදේශීය සභාව | 0.27 |
| 3 | වාරියපොල ප්‍රාදේශීය සභාව | 0.27 |
| 4 | පන්නල ප්‍රාදේශීය සභාව | 0.89 |
| 5 | රිදීගම ප්‍රාදේශීය සභාව | 1.58 |
| 6 | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | 1.13 |
| 7 | මහව ප්‍රාදේශීය සභාව | 0.67 |
| 8 | පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව | 0.23 |
| 9 | යටවත්ත ප්‍රාදේශීය සභාව | 0.65 |
| 10 | මැදදුම්බර ප්‍රාදේශීය සභාව | 0.94 |
| 11 | පන්විල ප්‍රාදේශීය සභාව | 1.12 |
| 12 | උඩ පළාත ප්‍රාදේශීය සභාව | 0.56 |
| 13 | හම්බන්තොට මහ නගර සභාව | 1.02 |
| 14 | කටුවන ප්‍රාදේශීය සභාව | 1.50 |
| 15 | නාගොඩ ප්‍රාදේශීය සභාව | 0.85 |
| 16 | තිහගොඩ ප්‍රාදේශීය සභාව | 0.80 |
| 17 | කොටපොල ප්‍රාදේශීය සභාව | 0.67 |
| **යෙදවූ මුළු මුදල** | | **13.60** |
| **මූල්‍ය ප්‍රගතිය** | | **68%** |

9.1.1 හි සඳහන් පරිදි පසුගාමී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ වැඩසටහන යටතේ පළාත් අනුව, පසුගාමී පළාත් පාලන ආයතන සඳහා යෙදවූ මුදල් බෙදී ගොස් ඇති ආකාරය පහත වගු අංක 01න් හා ප්‍රස්ථාර අංක 01න් පෙන්නුම් කෙරේ.

**පසුගාමී පළාත්පාලන ආයතන සඳහා පළාත් අනුව මුදල් යෙදවීම**

| | | |
|---|---|---|
| 1 | උතුරු මැද | 1,843,432 |
| 2 | දකුණ | 5,460,005 |
| 3 | මධ්‍යම | 350,000 |
| 4 | ඌව | 4,942,232 |
| 5 | නැගෙනහිර | 19,747,300 |
| 6 | වයඹ | 3,592,491 |
| 7 | බස්නාහිර | 1,513,000 |
| **එකතුව** | | **37,448,460** |

වගු අංක 01





ප්‍රස්ථාර අංක 01

9.1.2 හි සඳහන් පරිදි පළාත් පාලන ආයතන සතු වාහන අලුත්වැඩියා කිරීම සඳහා පළාත් අනුව මුදල් බෙදී ගොස් ඇති ආකාරය වගු අංක 02 න් හා ප්‍රස්ථාර අංක 02 න් පහත සඳහන් පරිදි පෙන්නුම් කෙරේ.

**පළාත් පාලන ආයතන වල වාහන අලුත්වැඩියා සඳහා පළාත් අනුව මුදල් යෙදවීම**

| | | |
|---|---|---|
| 1 | උතුරු මැද | 725,575 |
| 2 | වයඹ | 4,545,6 00 |
| 3 | නැගෙනහිර | 230,100 |
| 4 | මධ්‍යම | 3,272,829 |
| 5 | දකුණ | 4,828,372 |
| **එකතුව** | | **13,602,476** |

වගු අංක 02




ප්‍රස්ථාර අංක 02

### 9.1.3 පළාත් පාලන සතිය

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය තුළ එම ආයතන විසින් ඉටුකරනු ලබන මහජන උපයෝගීතා සේවා ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීමත්, මානව හා භෞතික සම්පත් උපයෝගී කරගැනීම තුළින් මහජනතාව වෙත උපරිම කාර්යක්ෂමතාවයකින් සේවා සැපයීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමත්, පළාත් පාලන ආයතන පිළිබඳව හා මහජන සේවාවන් පිළිබඳව ජනතාව අතර යහපත් ආකල්පයක් සහ මනා සම්බන්ධතාවයන් ගොඩනැගීම අරමුණ කරගෙන පළාත් පාලන සතිය තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වේ. මෙම වර්ෂයේද අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් පළාත් අනුව තෝරාගත් පළාත් පාලන ආයතන වල පළාත් පාලන සතිය තුළ ක්‍රියාවට නංවන ලද වැඩසටහන් නිරීක්ෂණයට ලක් කරන ලදී.

### 9.1.4 පළාත් පාලන කළමනාකරණ තරඟය සහ පළාත් පාලන ජාතික සමුළුව පැවැත්වීම

මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පළාත් පාලන ආයතනයන්හි යහපාලනය හා කළමනාකරණ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස ජාතික මට්ටමෙන් පළාත් පාලන කළමනාකරණ තරඟය පවත්වා අදාල ජයග්‍රාහී ආයතනවලට ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීම සහ එම ජයග්‍රාහී ආයතන ජාතික මට්ටමින් ඇගයීම සඳහා සහ ජයග්‍රාහී ආයතන වලට ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීම සඳහා පළාත් පාලන පිළිබඳ ජාතික මහා සමුළුව සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් 2013 ජනවාරි මස 08 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ පවත්නා ලදී.





2013 ජනවාරි මස 08 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පවත්වන ලද පළාත් පාලනය පිළිබඳ ජාතික මහ සමුළුවේදී ජයග්‍රහණය කරන ලද පළාත් පාලන ආයතන වෙත තිළිණ ප්‍රදානය කිරීමේ අවස්ථාවන්.

## *9.2* පළාත් සභා හා පුහුණු අංශය

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැළසීම, පළාත් සභාව සහ මධ්‍යම රජය අතර සම්බන්ධීකරණය හා මානව සම්පත් සංවර්ධනය යනාදී කටයුතු මෙම අංශය මගින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි. එසේම මෙම වසරේදී සියළුම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ගේ රැස්වීම් වාර 02ක් පවත්වා ප්‍රධාන ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා වලට අදාල පාර්ශ්වයන්ගෙන් අවශ්‍ය විසඳුම් ලබාදීමට කටයුතු කරන ලදී.

පළාත් රාජ්‍ය සේවයේ දීප ව්‍යාප්ත සේවාවල පුරප්පාඩු පිරවීම සඳහා එම සේවාවල විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සම්බන්ධ නිර්දේශ පදනම් කරගෙන අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**2013.12.31 දිනට මෙම අංශයේ ක්‍රියාකාරකම් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | කාර්යය | වෙන් කල මුදල (රු.මි) | සත්‍ය වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය % | මූල්‍ය හා භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | මානව සම්පත් සංවර්ධනය දේශීය හා විදේශීය පුහුණු ලබාදීම. | 1.25 | 1.25 | දේශීය පුහුණුව සඳහා නිලධාරීන් 179 දෙනෙකු සහ විදේශීය පුහුණුව සඳහා නිලධාරීන් 63 දෙනෙකු යොමු කිරීම. | මූල්‍ය ප්‍රගතිය 100% |
| 2 | පළාත් සභාවන් සඳහා වාහන මිලදී ගැනීම. | | | ඉල්ලීම් 12ක් නිර්දේශ කර භාණ්ඩාගාර අනුමැතිය ලබා දී ඇත. | භෞතික ප්‍රගතිය 100% |
| 3 | ධූරධාරීන්ගේ වරප්‍රසාද හා පහසුකම් සැළසීමට වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම. | | | ධූරධාරීන් සඳහා වාහන ආනයන බලපත්‍ර 364 ක් ලබාදීම. | භෞතික ප්‍රගතිය 100% |
| 4 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් මෙම අමාත්‍යාංශය වෙත එවනු ලබන සේවා ව්‍යවස්ථා පළාත් රාජ්‍ය සේවයට ගැලපෙන අයුරින් සකස් කිරීම. | | | තනතුරු 11 ක් සඳහා ඉදිරිපත් වී ඇති අතර, එයින් තනතුරු 5ක අදාල සේවා ව්‍යවස්ථා සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් නිර්දේශ ලබාගෙන ප්‍රධාන ලේකම්වරුන් වෙත යැවීමට කටයුතු කිරීම. | භෞතික ප්‍රගතිය 45% |

## *9.3* නීති අංශය

පිළිගත් ජාතික ප්‍රතිපත්ති ව්‍යුහයක් තුල මහජන ශුභ සිද්ධිය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාර පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන පරිපාලනමය හා සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, මග පෙන්වීම, නීතිමය, තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාදීම මෙහෙවර කොට ගත් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ නෛතිකමය කාර්යභාරය වඩාත් ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කරලීම උදෙසා අමාත්‍යාංශයීය නීති අංශය ස්ථාපිත කර ඇත.

### 9.3.1 කාර්යභාරය

1. උප ජාතික පාලනයේ දෙවන හා තෙවන ස්ථර අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාමේදී උද්ගත වන නෛතිකමය ගැටළු සම්බන්ධව මැදිහත් වීම, එහිදී පවත්නා නීතීන් හා අනු නීතීන් සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව නව නීතීන් හා අනු නීතීන් සැකසීමට අදාල කටයුතු කිරීම.
2. පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය තුල උද්ගත වන නෛතිකමය ගැටළු සම්බන්ධව උපදෙස් ලබා දීම.
3. අමාත්‍යාංශයට එරෙහිව අධිකරණයේ ගොනු කරනු ලබන පෙත්සම් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම.
4. පහළ අධිකරණ කටයුතු වලට සහභාගි වීම සහ අමාත්‍යාංශය නියෝජනය කිරීම.
5. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කරනු ලබන පෙත්සම්වලට අදාල කටයුතු කිරීම.

### 9.3.2 නීති අංශයේ 2013 වර්ෂයේ ප්‍රගතිය

මහ නගරසභා, නගරසභා, ප්‍රාදේශීය සභා ආඥා පනත් සංශෝධනය කිරීමේ අවසන් කෙටුම්පත නීතිපතිගේ නිරීක්ෂණ ලබා ගැනීමෙන් අනතුරුව ඒවා ඇතුලත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එමෙන්ම පීඩන ක්‍රියා ආඥා පනත සහ පොදු සුසානභූමි සහ පෞද්ගලික සුසානභූමි ආඥා පනත් සංශෝධනය කිරීමේ අවසන් කෙටුම්පත නීතිපති වෙත ඉදිරිපත් කිරීමද මෙම වර්ෂය තුලදී සිදු කරන ලදී.

## *9.4* සංවර්ධන හා සැලසුම් අංශය

දිවයිනේ විවිධ පළාත් වල ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයක් වේ. එකී සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම, ඊට අදාල ප්‍රගති සමාලෝචන හා සාකච්ඡා ජාතික මට්ටමින් පැවැත්වීම, පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ කාර්යභාරයන්ට අදාල අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තා ඇතුළු ප්‍රගති විමර්ශන වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සංවර්ධන හා සැලසුම් අංශය මගින් කෙරෙන ප්‍රධාන කාර්යයන් වේ.

### 9.4.1 පළාත් පාලන ආයතන සතු පුස්තකාල සංවර්ධනය

දිවයිනේ පළාත් පාලන ආයතන සතු අඩු පහසුකම් සහිත මහජන පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා 2013 වසර තුල රු.මි. 5 ක ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයේ අයවැය යටතේ වෙන් කරන ලදී. පවතින ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් ප්‍රමුඛතාවය මත එක් පළාතකින් අඩු පහසුකම් සහිත අත්‍යාවශ්‍යයෙන්ම දියුණු කළයුතු පුස්තකාලයක් බැගින් පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය මත තෝරා ගෙන එම පුස්තකාල සඳහා පොත්පත් ලබා දීම, කාර්යාලීය ලී බඩු සහ උපකරණ ලබා දීම හා පුස්තකාලවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම වැනි කාර්යයන් මෙම වැඩසටහන මගින් සිදු කෙරේ. මෙම වැඩසටහන පහත සඳහන් පළාත් පාලන ආයතන වල ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ග්‍රාමීය මට්ටමේ ඉතා අඩු පහසුකම් සහිත ප්‍රදේශවල වෙසෙන පාසැල් දරු දැරියන්ගේ හා පාඨක පිරිසගේ දැනුම් සම්භාරය වර්ධනය කර ගැනීමට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම මෙම වැඩසටනේ ප්‍රමුඛ අරමුණ වේ.

***2013*** වසර තුළදී සංවර්ධනය කරන ලද මහජන පුස්තකාල සහ ඉටුකරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

| **අනු අංකය** | **පළාත් පාලන ආයතනය** | **සංවර්ධන කාර්යයන්** |
|---|---|---|
| 1 | වීරකැටිය ප්‍රාදේශීය සභාව | අළුතින් ඉදි කරන ලද පුස්තාලය සඳහා කබඩ්, මේස, පුටු, රාක්ක, ආදිය ලබා දීම. |
| 2 | වැලිගෙපොළ ප්‍රාදේශීය සභාව | මහජන පුස්තකාලය සඳහා පුස්තකාල ගෘහ භාණ්ඩ, පරිගණක සහ පොත් ලබා දීම. |
| 3 | උඩුනුවර ප්‍රාදේශීය සභාව | ගෙලිඔය මහජන පුස්තකාලය සඳහා පරිගණක, පරිගණක මුද්‍රණයන්ත්‍ර, අත්පිඩක, කඩදාසි කපනය, පුටු, පොත් බැඳීමේ උපකරණ සහ පොත් රාක්ක ලබා දීම. |
| 4 | පුත්තලම  ප්‍රාදේශීය සභාව | වේළුසුමන මහජන පුස්තකාලය සඳහා ගොඩනැගිල්ල අලුත්වැඩියාව, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර සහ පොත් ලබා දීම. |
| 5 | හොරොව්පතාන ප්‍රාදේශීය සභාව | මහජන පුස්තකාලය සඳහා පොත් ලබා දීම. |
| 6 | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | මහජන පුස්තකාලය සඳහා මේස, පොත්, රාක්ක, ප්ලාස්ටික් නාම පුවරු, පරිගණක සහ පොත් ලබා දීම. |
| 7 | පාලින්දනුවර ප්‍රාදේශීය සභාව | මහජන පුස්තකාලය සඳහා පොත් රාක්ක සහ පොත් ලබා දීම |
| 8 | තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව | තම්පිලිවිල් - 02 මහජන පුස්තකාලය සඳහා මේස, පුටු, පොත් කබඩ් සහ පසුගිය ප්‍රශ්ණපත්‍ර ලබා දීම. |
| 9 | කයිට්ස් ප්‍රාදේශීය සභාව | නරන්තනයි නව පුස්තකාලය සඳහා පොත් කැබිනට්, මේස, පුටු සහ පොත් ලබා දීම. |
| **යෙදවූ මුදල** | | *රු. මිලියන 0.39 |
| **මූල්‍ය ප්‍රගතිය** | | 8% |
| **භෞතික ප්‍රගතිය** | | 100% |

***භෞතික ප්‍රගතිය 100% ක් වූ මෙම වැඩසටහන් වල ඉතිරි මුදල් 2014 වර්ෂයේදී ගෙවීමට නියමිතය.**

## 9.4.2 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සහ වැඩසටහන - 2013

මෙම අමාත්‍යාංශයේ මූලිකත්වයයෙන් සහ මෙහෙයවීමෙන් සියළුම පළාත් සභා නියෝජනය කරමින් 2013 මාර්තු 23 සිට අප්‍රේල් 01 දක්වා අම්පාර හාඩි උසස් තාක්ෂණික විද්‍යාල භූමිය තුළදී පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණයට පළාත් සභා පර්ෂදය ලෙස මෙම අමාත්‍යාංශය සාර්ථකව සහභාගී විය. 2013 දැයට කිරුළ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ නැගෙනහිර සහ උතුරුමැද දෙපළාතේ පළාත් පාලන ආයතන 16 ක් තුල විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව 2013 වර්ෂයට අදාල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

මෙහි මුළු වියදම රු.මි. 99.92 ක් වේ. ඒම මුදලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | 2013 වර්ෂයේ ගෙවීම් (රු.මි) | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|
| 1 | ඉපලෝගම ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල ඉදි කිරීම. | 2.56 | 100% |
| 2 | ඔයාමඩුව ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම. | 1.00 | 100% |
| 3 | අනුරාධපුර සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම. | 8.70 | 100% |
| 4 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය ඉදි කිරීම. | 3.65 | 100% |
| 5 | නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1.98 | 100% |
| 6 | මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ විලච්චිය සතිපොළ වැඩි දියුණු කිරීම. | 0.31 | 100% |
| 7 | පෙරියකුලම ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම. | 0.38 | 100% |
| 8 | හොරොව්පතාන ප්‍රාදේශීය සභා බිම් මහල ඉදි කිරීම. | 1.65 | 100% |
| 9 | කැකිරාව ප්‍රාදේශීය සභාවේ පොදු වෙළෙඳසැල හා රථගාල ඉදි කිරීම. | 3.49 | 100% |
| 10 | කහටගස්දිගිලිය බස් නැවතුම්පොළ ඉදි කිරීම. | 4.84 | 100% |
| 11 | දැයට කිරුළ ප්‍රදර්ශණ කටයුතු සඳහා | 14.00 | 100% |
| 12 | ප්‍රාදේශීය සභාවල පොදු පහසුකම් බල ගැන්වීමේ වැඩසටහන | 2.24 | 100% |

| අනු අංකය | ව්‍යාපෘතිය | 2013 වර්ෂයේ ගෙවීම් (රු.මි) | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|
| 13 | රාජාංගනය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 0.43 | 100% |
| 14 | මිහින්තලේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදි කිරීම. | 2.14 | 100% |
| 15 | කැබතිගොල්ලෑව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදි කිරීම. | 3.94 | 100% |
| 16 | කුඩා නෙළුම්බැව සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා භාණ්ඩ මිලදී ගැනීම. | 1.62 | 100% |
| 17 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය ඉදි කිරීම. | 1.21 | 100% |
| 18 | නොච්චියාගම ප්‍රාදේශීය සභා පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1.14 | 100% |
| 19 | රඹෑව ප්‍රාදේශීය සභා ආපන ශාලා ගොඩනැගිල්ල ඉදි කිරීම. | 0.88 | 100% |
| 20 | මහබුලංකුලම කෘෂි අලෙවි මධ්‍යස්ථානයේ ගබඩා සංකීර්ණය ඉදි කිරීම. | 1.96 | 100% |
| 21 | නාච්චදූව කුඩා නෙළුබැව සායන මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම. | 0.73 | 100% |
| 22 | කුඩා නෙළුබැව තුරුලිය සෙවන ආර්ථික මධ්‍යස්ථානයේ වැට හා ආරක්ෂක කුටිය ඉදි කිරීම. | 1.54 | 100% |
| 23 | ගලෙන්බිඳුණුවැව ජල ව්‍යාපෘතිය සඳහා ජලනල උපාංග මිලදී ගැනීම. | 3.45 | 100% |
| 24 | කැකිරාව ප්‍රාදේශීය සභා පොදු වෙළෙඳසැල ඉදි කිරීම හා රථගාල ඉදි කිරීම. | 1.08 | 100% |
| 25 | රාජාංගනය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පළමු මහල ඉදි කිරීම. | 0.77 | 100% |
| 26 | එරාවූර් නගර සභා ගංවතුර පාලන ව්‍යාපෘතිය සඳහා | 4.92 | ඉදි කරමින් පවතී. |
| 27 | දමන ප්‍රාදේශීය සභා සංචාරක නිවාසය ඉදි කිරීම. | 1.44 | ඉදි කරමින් පවතී |
| 28 | වෙරුගල් ප්‍රාදේශීය සභා ළමා උද්‍යානය ඉදි කිරීම. | 2.95 | ඉදි කරමින් පවතී |
| 29 | දමන ප්‍රාදේශීය සභාව සඳහා පොදු පහසුකම් සැපයීම. | 0.42 | 100% |

| අනු අංකය | ව්‍යාපෘතිය | 2013 වර්ෂයේ ගෙවීම් (රු.මි) | භෞතික ප්‍රගතිය% |
|---|---|---|---|
| 30 | උහන ප්‍රාදේශීය සභාවේ වැඩසටහන් සඳහා | 1.29 | 100% |
| 31 | අම්පාර නගර සභාවේ වාහන අළුත්වැඩියා කටයුතු | 0.66 | 100% |
| 32 | වෙන්කලාඩි පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 0.90 | 100% |
| 33 | රඹෑව ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 4.11 | 100% |
| 34 | මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 3.82 | 100% |
| 35 | හොරොව්පතාන ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1.48 | 100% |
| 36 | තිරප්පනේ ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1.79 | 100% |
| 37 | ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1.99 | 100% |
| 38 | රඹෑව ප්‍රාදේශීය සභා කම්බි වැට හා ඉදිරිපස ගේට්ටුව ඉදි කිරීම. | 0.36 | 100% |
| 39 | නාමල්ඔය ප්‍රාදේශීය සභා සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම. | 5.17 | ඉදි කරමින් පවතී |
| 40 | කාරතිව් ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය ඉදි කිරීම. | 1.04 | ඉදි කරමින් පවතී |
| 41 | මැදවච්චිය ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම. | 1.49 | 100% |
| 42 | අම්පාර නගරසභා වාහන අළුත්වැඩියාව | 0.40 | 100% |
| | **එකතුව** | **99.92** | |

**දැයට කිරුළ සමස්ථ ප්‍රතිපාදන (රු.මිලියන) - 100.00**

**මුළු වියදම (රු.මිලියන) - 99.92**

**සමස්ථ මූල්‍ය ප්‍රගතිය - 99.92%**

## 2013 දැයට කිරුළට සමගාමීව ක්‍රියාකාරී අවස්ථාවන්



දැයට කිරුළ ජංගම සේවාවලදී ජංගම මඩු භාවිතා කරන අවස්ථාවක්



දැයට කිරුළ මාර්ග සතිය තුළදී ගල්ගමුව ප්‍රා.ස. ග්‍රාමීය මාර්ග පිළිසකර කිරීමේ අවස්ථාවක්



දැයට කිරුළට සමගාමීව මහඔය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල විවෘත කිරීම

## 9.4.3 කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධනය

නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන ආයතන වල තාක්ෂණික සහ උපදේශාත්මක සහය ඇතිව පළාත් සභාවල ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තු සහ පළාත් පාලන කොමසාරිස් කාර්යාල වල මැදිහත් වීම ඇතිව කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන නව අංගයක් බවට පත් වී ඇත.

| නගරය | 2013 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති | 2013 භෞතික ප්‍රගතිය % | 2013 මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| **හක්මණ නගර සංවර්ධනය (2008-2016) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 406.00<br>සමස්ථ වියදම 302.99<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 75% | • ආදාහනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම<br>• නගරසභා ශාලාව ඉදි කිරීම<br>• පුස්තකාල උපකරණ මිලදී ගැනීම<br>• වෙළෙඳසැල් පහසුකම් ප්‍රවර්ධනය කිරීම<br>• නාගරික පිවිසුම් මාර්ග ප්‍රතිසංස්කරණය | 100<br>100<br>100<br>100<br>100 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.40.00<br>සත්‍ය වියදම රු.මි.39.99<br>මූල්‍ය ප්‍රගතිය 100% |
| **දෙහිඕවිට නගර සංවර්ධනය (2010-2014) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 250.00<br>සමස්ථ වියදම 204.86<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 82% | • බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 85 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.35.00<br>සත්‍ය වියදම රු.මි.27.86<br>මූල්‍ය ප්‍රගතිය 80% |
| **පල්ලේපොළ නගර සංවර්ධනය (2010-2016) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 350.00<br>සමස්ථ වියදම 24.84<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 7% | • බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 25 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.20.00<br>සත්‍ය වියදම රු.මි.5.84<br>මූල්‍ය ප්‍රගතිය 29% |
| **පඩුවස්නුවර නගර සංවර්ධනය (2011-2016) (රු.මිලියන)**<br>ව්‍යාපෘති පිරිවැය 250.00<br>සමස්ථ වියදම 102.13<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 41% | • ඒස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක ම.ම. විද්‍යාලේ පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම<br>• නව පරිපාලන ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම<br>• ආදාහනාගාරය ඉදිකිරීම<br>• බස් නැවතුම් ඉදිකිරීම | 100<br>40<br>87<br>60 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.70.00<br>සත්‍ය වියදම රු.මි.69.13<br>මූල්‍ය ප්‍රගතිය 99% |

| | | | |
|---|---|---|---|
| **බෙලිඅත්ත නගර සංවර්ධනය (2011-2016) (රු.මිලියන)**<br><br>ව්‍යාපෘති පිරිවැය 300.00<br>සමස්ථ වියදම 46.73<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 16% | • ළමා උද්‍යානය හා ක්‍රීඩාපිටිය ඉදිකිරීම<br>• වාහන නැවතුම්පොළ ඉදි කිරීම<br>• නාගරික පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම | ආරම්භක අදියර | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.50.00<br>සත්‍ය වියදම රු.මි.5.73<br>මූල්‍ය ප්‍රගතිය 11% |
| **හොරණ නගර සංවර්ධනය (2010-2016) (රු.මිලියන)**<br><br>ව්‍යාපෘති පිරිවැය 300.00<br>සමස්ථ වියදම 36.93<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 12% | • පුස්තකාලය නවීකරණය කිරීම<br>• පැරණි උසාවි ගොඩනැගිල්ල නවීකරණය කර අංග සම්පූර්ණ නගර සභා කාර්යාලයක් එහි ස්ථාපිත කිරීම<br>• නගර ශාලාවට උපකරණ මිලදී ගැනීම<br>• මහජන පොළ ඉදි කිරීම | 100<br>100<br>100<br>- | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.25.00<br>සත්‍ය වියදම රු.මි.24.93<br>මූල්‍ය ප්‍රගතිය 100% |
| **අක්කරෙයිපත්තුව නගර සංවර්ධනය (2011-2016) (රු.මිලියන)**<br><br>ව්‍යාපෘති පිරිවැය 300.00<br>සමස්ථ වියදම 227.79<br>සමස්ථ මූල්‍ය ප්‍රගතිය 76% | • පොදු වෙළඳ පොළ ඉදිකිරීම<br>• මහ නගරශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම<br>• ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදි කිරීම | 75<br>75<br>95 | ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.86.29<br>සත්‍ය වියදම රු.මි.84.79<br>මූල්‍ය ප්‍රගතිය 98% |

සාර්ථකව ක්‍රියාත්මක කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ නගර සංවර්ධන වැඩසටහන් වල විවිධ අවස්ථාවන් මෙසේය.

## හක්මණ නගර සංවර්ධනය



නගර ශාලාව



ක්‍රීඩාගාරය



අභ්‍යන්තර මාර්ග සකස් කිරීම

## හොරණ නගර සංවර්ධනය



නගර සභා ගොඩනැගිල්ල



පුස්තකාලය

## අක්කරෙයිපත්තුව නගර සංවර්ධනය



මහනගර සභා සංකීර්ණය



පොදු වෙළඳසැල

## දෙහිඕවිට නගර සංවර්ධනය



## *9.5* අපද්‍රව්‍ය කළමනාකරණය

**දැක්ම**
සැමට වඩාත් සුවදායී පරිසරයක්

**අරමුණ**
පළාත් පාලන බල ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**ප්‍රතිපත්ති හා උපායමාර්ග :**

**1. කසළ ජනනය අවම කිරීම**

ගෘහස්ථ වාණිජ හා කාර්මික අංශයන්හි කසළ ජනනය අවම කිරීම පිණිස පාර්ශ්වකරුවන් දිරිගැන්වීම සඳහා විවිධ ක්‍රමෝපායන් හඳුන්වා දීම.

**2. සම්පත් ප්‍රතිජනනය උපරිම කිරීම**

- කසළ ජනනය වන ස්ථානයේදීම වර්ගීකරණය කිරීම.
- දිරායන අපද්‍රව්‍ය වලින් නිවසේදීම කොම්පෝස්ට් නිපදවීමට නිවැසියන් යොමු කිරීම.
- පළාත් පාලන ආයතන මඟින් නගර කේන්ද්‍රකර ගත් කොම්පෝස්ට් මධ්‍යස්ථාන ඇති කිරීම.
- කසළ ප්‍රතිචක්‍රීයකරණය ක්‍රම හඳුන්වා දීම හා ජනතාව දිරි ගැන්වීම.

**3. සනීපාරක්ෂක බිම් පිරවුම් හඳුන්වා දීම**

**9.5.1 අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ යෙදවුම් වල *2013/12/31* දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති බල ප්‍රදේශය | සත්‍ය වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| ගෘහස්ථ කොම්පෝස්ට් බැරල් ව්‍යාපෘතිය | කොබෙයිගනේ ප්‍රා.ස | 0.10 | 100% | 100% |
| | කුණ්ඩසාලේ ප්‍රා.ස | 0.07 | 100% | 100% |
| | රත්තොට ප්‍රා.ස | 0.17 | 100% | 100% |
| | මහනුවර ම.න.ස | 0.45 | 100% | 100% |
| | හෝමාගම ප්‍රා.ස | 0.30 | 100% | 100% |
| | මැදදුම්බර ප්‍රා.ස | 0.12 | 50% | 100% |
| | පාතදුම්බර ප්‍රා.ස | 0.08 | 100% | 100% |
| | තලවකැලේ ලිඳුල ප්‍රා.ස | 0.11 | 67% | 100% |
| ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම | වැලිගම න.ස | 2.96 | 118% | 100% |
| පරිසර සංරක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (කොම්පෝස්ට් අංගනයන් ස්ථාපිත කිරීම, වැඩිදියුණු කිරීම හා කොම්පෝස්ට් ව්‍යාපෘති) | රත්නපුර ම.න.ස | 1.55 | 143% | 100% |
| | කුලියාපිටිය න.ස | 0.11 | 100% | 100% |
| | බැද්දේගම ප්‍රා.ස | 0.69 | 100% | 100% |
| | තංගල්ල න.ස | 2.04 | 100% | 100% |
| | කල්පිටිය ප්‍රා.ස | 1.96 | 41% | 100% |
| | නොච්චියාගම ප්‍රා.ස | 0.89 | 100% | 40% |
| | කින්නියා න.ස | 1.93 | 75% | 100% |
| | මධ්‍යම නුවරගම් පළාත ප්‍රා.ස | 0.24 | 26% | 100% |
| | මිණිපේ ප්‍රා.ස | 3.36 | 129% | 90% |
| | මහියංගන ප්‍රා.ස | 3.66 | 60% | 45% |
| | ඌව පරණගම ප්‍රා.ස | 1.63 | 25% | 100% |
| | මඩුල්ල ප්‍රා.ස | 0.04 | 40% | 100% |

| | | | | |
|---|---|---|---|---|
| කසළ වෙන් කිරීම් බඳුන් ලබාදීම | ඌව පළාත | 2.0 | 100% | 60% |
| | උතුරු මැද පළාත | 2.0 | 100% | 60% |
| | නැගෙනහිර පළාත | 2.0 | 100% | 60% |
| | උතුරු පළාත | 2.0 | 100% | 60% |
| | මධ්‍යම පළාත | 2.0 | 100% | 60% |
| | බස්නාහිර පළාත | 2.5 | 100% | 60% |
| | වයඹ පළාත | 2.5 | 100% | 60% |
| | සබරගමුව පළාත | 2.5 | 100% | මූලික කටයුතු කරමින් පවතී |
| | දකුණු පළාත | 2.5 | 100% | 60% |
| | ඉබ්බාගමුව ප්‍රා.ස | 0.21 | 100% | 60% |
| **මුළු එකතුව** | | ***42.67*** | | |

## අපද්‍රව්‍ය කළමනාකරණයේ විවිධ අවස්ථාවන්

**ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම - වැලිගම නගර සභාව**





**පරිසර සංරක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**



කල්පිටිය ප්‍රාදේශීය සභාව



නොච්චියාගම ප්‍රාදේශීය සභාව



අවසන් අපහරණ භූමිය - රත්නපුර මහා නගර සභාව




2013 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව පාසල් දරුවන් සඳහා පැවැත්වූ චිත්‍ර තරඟයට සහභාගිවූ දරුවකුට අමාත්‍යාංශ ලේකම්තුමා ත්‍යාගයක් පිරිනැමීම.

**ව්‍යාපෘති අනුව කසළ කළමනාකරණය සඳහා දැරූ වියදම වගු අංක 03 හා ප්‍රස්ථාර අංක 03 න් දැක්වේ.**

| අනු අංකය | ව්‍යාපෘතිය | දැරූ වියදම (රු.මිලියන) |
|---|---|---|
| 01 | ගෘහස්ථ කොම්පොස්ට් බැරල් ලබාදීම | 1.40 |
| 02 | කසළ වෙන් කිරීමේ බඳුන් ලබාදීම | 20.21 |
| 03 | පරිසර සංරක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | 21.06 |
| **එකතුව** | | **42.67** |

වගු අංක 03





ප්‍රස්ථාර අංක 03

පළාත් අනුව කසළ කළමනාකරණය සඳහා දැරූ සත්‍ය වියදම පහතින් දැක්වේ.

| අනු අංකය | පළාත | වියදම (රු.මි) |
|---|---|---|
| 1 | බස්නාහිර | 2.80 |
| 2 | වයඹ | 4.88 |
| 3 | ඌව | 7.33 |
| 4 | මධ්‍යම | 6.36 |
| 5 | උතුරු මැද | 3.63 |
| 6 | උතුර | 2.00 |
| 7 | දකුණ | 7.69 |
| 8 | සබරගමුව | 4.05 |
| 9 | නැගෙනහිර | 3.93 |
| එකතුව | | **42.67** |

වගු අංක 04




ප්‍රස්ථාර අංක 04

## 9.5.2. අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ ක්‍රියාත්මක කල විශේෂ ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති බල ප්‍රදේශය | ඇස්තමේන්තු ගත මුදල රු.මි | මූල්‍ය ප්‍රගතිය 2013 රු.මි | භෞතික ප්‍රගතිය 2013 |
|---|---|---|---|---|---|
| 1 | දීප ව්‍යාප්ත අප ද්‍රව්‍ය කළමනාකරණ තරඟය පැවැත්වීම | දිවයිනේ සියලුම පළාත් පාලන ආයතන වලින් හොඳම අප ද්‍රව්‍ය ක්‍රියාවලීන් සහිත ආයතනය තේරීම මෙහිදී සිදු වේ. | 3.765 | 2.98 | 100% |
| 2 | අම්පාර - හාඩි විද්‍යාලය පැවති 2013 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණයට සමගාමීව පිවිතුරු නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (දැයට කිරුළ ප්‍රතිපාදන) | අම්පාර නගර සභාව | 2.450 | 2.450 | 100% |
| | | උහන ප්‍රා.ස | 1.642 | 0.328 | 100% |
| | | නාමල්ඔය ප්‍රා.ස | 1.352 | 0.270 | 100% |
| 3 | දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණයට සමගාමීව පාසල් දරුවන් සඳහා චිත්‍ර තරඟයක් පැවැත්වීම හා ත්‍යාග ප්‍රදානය කිරීම (අනුග්‍රහය - Solex) | අම්පාර ප්‍රදේශයේ දරුවන් මේ සඳහා සහභාගි විය. | 0.055 | 0.055 | 75% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | ජගත් පරිසර දිනයට සමගාමීව පාසල් සිසුන් දැනුවත් කිරීම | ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය හා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට අයත් පාසල් 5 ක සිසුන් සඳහා (ධර්මාශෝක විද්‍යාලය, ශ්‍රී දේවානන්ද විද්‍යාලය, එස්. කුලරත්න විද්‍යාලය, ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලය, ගාමිණී විද්‍යාලය) | - | - | 100% |
| 5 | බැකෝ යන්ත්‍ර මිලදී ගැනීම | අපද්‍රව්‍ය කළමනාකරණ කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා | 9.5 | 9.5 | 100% |
| 6 | අප ද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ප්‍රචාරණ කටයුතු | 0.46 | 0.46 | 100% |
| 7 | පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි නාගරික කසළ ක්‍රමවත්ව එකතු කිරීම සඳහා කසළ බඳුන් නොමිලේ ලබා දීම. | මේ සඳහා හේලීස්, ICF හා BASFයන ආයතන වල අනුග්‍රහය යටතේ පහත සඳහන් පළාත්පාලන ආයතන සඳහා නොමිලේ කසළ බඳුන් ලබා දී ඇත.<br><br>ත්‍රිකුණාමලය න.ස<br>මන්නාරම න.ස<br>එරාවූර් න.ස<br>අම්පාර න.ස<br>සීතාවකපුර න.ස<br>කහටගස්දිගිලිය ප්‍රා.ස<br>තිරප්පනේ ප්‍රා.ස<br>ඇල්ල ප්‍රා.ස<br>පල්ලේපොල ප්‍රා.ස<br>හාරිස්පත්තුව ප්‍රා.ස<br>පඩුවස්නුවර ප්‍රා.ස<br>අත්තනගල්ල ප්‍රා.ස<br>මහව ප්‍රා.ස<br>ගල්ගමුව ප්‍රා.ස<br>ගිරිබාව ප්‍රා.ස | - | - | 100% |

## 9.5.3. පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ඩෙංගු මර්දන වැඩසටහන

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ එක් අංශයක් ලෙස ඩෙංගු මර්දන ඒකකය ස්ථාපිත කොට ඇත.

### අරමුණ

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම ආයතන මූලික කොට ගෙන ඩෙංගු අවදානම් සහිත පරිසරයන් අවම කිරීමට අවශ්‍ය වැඩසටහන් සම්පාදනය හා ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් ඩෙංගු රෝගී තත්වයෙන් තොර පරිසරයක් ගොඩ නැගීම.

### දැනට සිදුකර ඇති වැඩසටහන්

- 2013 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ඩෙංගු මර්දනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය සහ පළාත් පාලන ආයතන විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් සහිත වාර්තාවක් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලය දැනුවත් කිරීම.

- ඩෙංගු අධි අවදානම් කලාප ලෙස නම්කර ඇති පළාත් පාලන ආයතන සඳහා ඔවුන් එම අවදානමේ සිටින බවට ලිඛිතව දැනුම් දීමට අවශ්‍ය කටයුතු කිරීම හා නිරීක්ෂණ චාරිකා මගින් අමාත්‍යාංශ නිලධාරීන් විසින් ඔවුන් දැනුවත් කිරීම.

- ඩෙංගු මර්දනය සම්බන්ධයෙන් කෙටි කාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 9.6 විමංසන අංශය හා ගිණුම් අංශය

### 9.6.1 පළාත් සභා ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය

පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් වාර්ෂිකව දෙනු ලබන ප්‍රදානයන් එම ආයතන විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් කිරීම විමංසන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යය සඳහා මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානය, පළාත් සභා ඇස්තමේන්තු, සත්‍ය ආදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු උපයෝගී කර ගනී. මෙම තොරතුරු විමංසනය තුළින් මතුවන විචල්‍යතා හා ගැටළු පළාත් මූල්‍ය කළමනාකරණයේ අවධානයට ලක්කිරීමට කටයුතු කරන අතර, එමඟින් තම මූල්‍ය කටයුතුවල අපේක්ෂිත ඉලක්කයන් කරා පළාත් සභා යොමු කරවීම අරමුණු කෙරේ.

ඒ අනුව 2011, 2012 සහ 2013 වර්ෂ වලදී පළාත් සභා වෙතින් ලබා ගත් තොරතුරු අනුව පිළියෙල කරන ලද පළාත් සභා ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### (අ). මධ්‍යම රජයේ ප්‍රදාන හා එම ප්‍රදාන මුදා හැරීම්

(රු. මි)

| ප්‍රදාන වර්ගය | 2011 | | | 2012 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | 2013.12.31 දිනට මුදා හැරීම් | % |
| (අ).පුනරාවර්තන වියදම (සාමූහික ප්‍රදාන) | 94,603 | 94,603 | 100 | 94,877 | 91,551 | 96 | 108,765 | 97,713 | 90 |
| **(අ). මුළු පුනරාවර්තන ප්‍රදාන** | **94,603** | **94,603** | **100** | **94,877** | **91,551** | **96** | **108,765** | **97,713** | **90** |
| (ආ).ප්‍රග්ධන ප්‍රදාන | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන | 4,460 | 3,854 | 86 | 4,375 | 2,859 | 65 | 2,390 | 2,284 | 96 |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 12,019 | 9,952 | 83 | 13,520 | 6,409 | 47 | 16,609 | 6,720 | 40 |
| **(ආ) මුළු ප්‍රග්ධන ප්‍රදාන** | **16,479** | **13,806** | **84** | **17,895** | **9,268** | **52** | **18,999** | **9,004** | **47** |
| **මුළු ප්‍රදාන (අ+ආ)** | **111,082** | **108,409** | **98** | **112,772** | **100,819** | **89** | **127,764** | **106,717** | **84** |

## (ආ).පළාත් සභා මුළු ආදායම

(රු.මි.)

| ආදායම් වර්ගය | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | 2011.12.31 දිනට සත්‍ය ආදායම් | ඇස්තමේන්තුව | 2012.12.31 දිනට සත්‍ය ආදායම් | ඇස්තමේන්තුව | *2013.12.31* දිනට සත්‍ය ආදායම් |
| පිරිවැටුම් බදු | 19,352.0 | 4,617 | 635 | 188 | 81 | 117 |
| වාහන බලපත්‍ර ගාස්තු | 3,934.0 | 4,362 | 4,737 | 5,142 | 5,090 | 6,588 |
| මත්පැන් බලපත්‍ර ගාස්තු | 362.0 | 577 | 658.00 | 794 | 756 | 835 |
| පොළී | 1,063.0 | 1,244 | 1,430 | 1,921 | 1,184 | 1,884 |
| උසාවි දඩ | 1,021.0 | 1,465 | 1,673 | 1,890 | 1,621 | 1,891 |
| මුද්දර ගාස්තු | 5,933.0 | 13,987 | 6,266 | 6,458 | 7,636 | 6,678 |
| අනෙකුත් | 4,196.0 | 14,739 | 36,006 | 32,842 | 42,264 | 31,655 |
| **මුළු ආදායම** | **35,861.0** | **40,991** | **51,405** | **49,235** | **58,632** | **49,648** |

## (ඇ).පළාත් සභාවන්හි පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම

(රු.මි.)

| වියදමේ ස්වභාවය | 2011 | | | 2012 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | සත්‍ය | % | ඇස්තමේන්තුව | *2013.12.31* දිනට සත්‍ය වියදම් | % |
| (අ).පුනරාවර්තන වියදම | 128,860 | 129,601 | 101 | 145,229 | 139,120 | 96 | 162,837 | 154,129 | 95% |
| (ආ).ප්‍රග්ධන වියදම | | | | | | | | | |
| උපමාන පාදක ප්‍රදාන | 5,958 | 6,612 | **111** | 10,445 | 8,223 | 79 | 9,371 | 8,117 | 87% |
| පළාත් කාර්යය නිශ්චිත සංවර්ධන ප්‍රදාන * | 11,810 | 10,364 | 88 | 13,520 | 8,866 | 66 | 10,771 | 6,720 | 62% |
| **(ආ).ප්‍රග්ධන වියදම් එකතුව** | **17,768** | **16,976** | **96** | **23,965** | **17,089** | **71** | **20,142** | **14,937** | **74%** |
| **මුළු එකතුව (අ+ආ)** | **146,628** | **146,577** | **100** | **169,194** | **156,209** | **92** | **182,979** | **169,066** | **95%** |

* – පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අධ්‍යාපනය හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ ප්‍රදානද ඇතුළත් වේ.

2011* - 2011 වර්ෂයේ ඇස්තමේන්තුවට අතිරේක ප්‍රතිපාදන ඇතුළත් වී නොමැත.

## 9.6.2. පළාත් අනුව පළාත් පාලන ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් පළාත් පාලන ආයතන 335ක් පළාත් සභා 09 යටතේ ක්‍රියාත්මක වේ. මෙම පළාත් පාලන ආයතන වල ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන්නේ වරිපනම් බදු, කුලී, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ, මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල්ය. මෙයට අමතරව මධ්‍යම රජය, පළාත් සභා හා අනෙකුත් සංවිධාන විසින් ආදායම් ආධාර සහ ප්‍රාග්ධන ආධාරද මෙම ආයතන වලට ලබා දෙනු ලැබේ.

එසේම මෙම පළාත් පාලන ආයතන වල ප්‍රධාන වියදම් වර්ගීකරණයන් වන්නේ වැටුප් ගෙවීම්, ගමන් ගාස්තු, මිලදී ගැනීම් හා කාර්යාල අවශ්‍යතා, ප්‍රාග්ධන වත්කම් නඩත්තු වියදම්, ප්‍රවාහන ගාස්තු, පොළී ගෙවීම්, ආධාර ගෙවීම්, විශ්‍රාම වැටුප් ගෙවීම් සහ ප්‍රග්ධන වැය යනාදියයි.

පළාත් පාලන ආයතන වල ආදායම්, වියදම්, කාර්ය මණ්ඩල තොරතුරු සහ පොදු පහසුකම් යනාදිය ඇතුලත් වාර්තාවක් සෑම වර්ෂයකම විමංසන අංශය විසින් පිළියෙල කරනු ලබන අතර 2013 වර්ෂය සඳහා ද එම වාර්තාව පිළියෙල කර ඇත.මෙම වාර්තාව මගින් පෙන්නුම් කරනු ලබන තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන වෙත යොමු කරනු ලැබේ.

ඒ අනුව, 2013 වර්ෂයට අදාල සත්‍ය ආදායම් සහ වියදම් විස්තර පහත සඳහන් පරිදි වේ.

**(අ). පළාත් අනුව පළාත් පාලන ආයතන වල 2013 වර්ෂයේ ආදායම (රු.මිලියන)**

| පළාත | ප.ප.ආ. සංඛ්‍යාව | ආදායම් ඇස්තමේන්තුව | සත්‍ය ආදායම | | | මුළු ආදායම | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| | | | ආදායම් ආධාර | ප්‍රාග්ධන ආධාර | සභා ආදායම | | |
| බස්නාහිර | 48 | 24,785 | 4,578 | 1,304 | 10,394 | 16,275 | 65% |
| මධ්‍යම | 43 | 6,921 | 1,300 | 962 | 2,443 | 4,705 | 68% |
| දකුණ | 49 | 5,769 | 1,180 | 1,217 | 1,393 | 3,790 | 65% |
| උතුර | 34 | 4,001 | 785 | 756 | 891 | 2,432 | 60% |
| වයඹ | 33 | 4,294 | 730 | 684 | 1,647 | 3,061 | 71% |
| උතුරු මැද | 26 | 2,656 | 235 | 822 | 596 | 1,654 | 62% |
| ඌව | 28 | 1,813 | 427 | 380 | 677 | 1,484 | 81% |
| සබරගමුව | 29 | 2,320 | 489 | 409 | 853 | 1,751 | 75% |
| නැගෙනහිර | 45 | 4,665 | 605 | 1,100 | 881 | 2,586 | 55% |
| **එකතුව** | **335** | ***57,224*** | **10,329** | ***7,634*** | ***19,775*** | ***37,738*** | **63%** |

**(ආ).පළාත් අනුව පළාත් පාලන ආයතන වල 2013 වර්ෂයේ වියදම (රු.මිලියන)**

| පළාත | ප.ප.ආ. සංඛ්‍යාව | වියදම් ඇස්තමේන්තුව | සත්‍ය වියදම | | මුළු වියදම | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රාග්ධන | පුනරාවර්තන | | |
| බස්නාහිර | 48 | 24,946 | 2,602 | 12,643 | 15,245 | 61% |
| මධ්‍යම | 43 | 6,961 | 1,506 | 2,960 | 4,466 | 64% |
| දකුණ | 49 | 6,064 | 1,514 | 2,062 | 3,576 | 58% |
| උතුර | 34 | 3,688 | 1,170 | 1,315 | 2,485 | 67% |
| වයඹ | 33 | 4,603 | 1,015 | 1,989 | 3,004 | 65% |
| උතුරු මැද | 26 | 2,254 | 625 | 966 | 1,591 | 70% |
| ඌව | 28 | 1,909 | 472 | 910 | 1,382 | 72% |
| සබරගමුව | 29 | 2,515 | 496 | 1,109 | 1,605 | 63% |
| නැගෙනහිර | 45 | 4,343 | 1,057 | 1,211 | 2,268 | 52% |
| **එකතුව** | **335** | **57,283** | ***10,457*** | ***25,165*** | ***35,622*** | ***62%*** |

## 9.6.3 පළාත් පාලන ආයතන වලට වාහන හා යන්ත්‍රෝපකරණ ලබා දීම.

අමාත්‍යාංශයට අදාල සමස්ත වැය ප්‍රතිපාදන මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, ගිණුම් තැබීමේ කටයුතු මෙහෙයවීම යනාදිය ගිණුම් අංශය විසින් සිදු කරන අතර මධ්‍යම රජය විසින් පළාත් සභා වලට සාමූහික ප්‍රදාන වශයෙන් පුනරාවර්තන වියදම සඳහා වාර්ෂික අයවැය ලේඛණයෙන් වෙන් කරනු ලබන මුදල ලබාදීම මෙන්ම, පළාත් පාලන ආයතන වලට අවශ්‍ය මූල්‍ය සහය ලබා දීමද මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

2013 වර්ෂයේ මෙම අංශයේ දායකත්වය ඇතිව අමාත්‍යාංශය විසින් පහත සඳහන් කර ඇති වාහන ලබා දීමට කටයුතු කර ඇත.

| අනු අංකය | වාහන වර්ගය | ලබාදුන් ආයතනය | වැය වූ මුදල (රු.මි) |
|---|---|---|---|
| 1 | නවතම වර්ගයේ TAFE ට්‍රැක්ටර් හා ට්‍රේලර් (100) | ගම්පහ ප්‍රා.ස, ජා ඇල ප්‍රා.ස, දිවුලපිටිය ප්‍රා.ස, මහර ප්‍රා.ස, මිනුවන්ගොඩ ප්‍රා.ස, බියගම ප්‍රා.ස, කඩුවෙල ම.න.ස, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රා.ස, කැස්බෑව ප්‍රා.ස, හොරණ න.ස, මදුරාවෙල ප්‍රා.ස, හොරණ ප්‍රා.ස, බුලත්සිංහල ප්‍රා.ස, උඩුබද්දාව ප්‍රා.ස, වාරියපොළ ප්‍රා.ස, රිදීගම ප්‍රා.ස, බිංගිරිය ප්‍රා.ස, මහව ප්‍රා.ස, ගිරිබාව ප්‍රා.ස, කුළියාපිටිය න.ස, ගල්ගමුව ප්‍රා.ස, ඉබ්බාගමුව ප්‍රා.ස, පොල්ගහවෙල ප්‍රා.ස, වනාතවිල්ලුව ප්‍රා.ස, කරුවලගස්වැව ප්‍රා.ස, ආනමඩුව ප්‍රා.ස, චත්තේගම න.ස, කඩුගන්නාව න.ස, හාරිස්පත්තුව ප්‍රා.ස, පාතදුම්බර ප්‍රා.ස, පූජාපිටිය ප්‍රා.ස, ගඟවටකෝරළේ ප්‍රා.ස, අකුරණ ප්‍රා.ස, දඹුල්ල ම.න.ස , උකුවෙල ප්‍රා.ස, ගලේවෙල ප්‍රා.ස, යටවත්ත ප්‍රා.ස, මාතලේ ප්‍රා.ස, තලවකැළේ ළිඳුල න.ස, හැටන් දික්ඔය න.ස, වලපනේ ප්‍රා.ස, හපුතලේ න.ස, මහියංගනය ප්‍රා.ස, හල්දුම්මුල්ල ප්‍රා.ස, මොනරාගල ප්‍රා.ස, බලපිටිය ප්‍රා.ස, යක්කලමුල්ල ප්‍රා.ස, වැලිවිටිය දිවිතුර ප්‍රා.ස, ඇල්පිටිය ප්‍රා.ස, නෙළුව ප්‍රා.ස, අක්මීමණ ප්‍රා.ස, හික්කඩුව න.ස, බෙන්තොට ප්‍රා.ස, මාතර ම.න.ස , වැලිගම න.ස, කඹුරුපිටිය ප්‍රා.ස, පස්ගොඩ(ඌරුබොක්ක) ප්‍රා.ස, හම්බන්තොට ම.න.ස, ලුනුගම්වෙහෙර ප්‍රා.ස, තංගල්ල ප්‍රා.ස, තිස්සමහාරාම ප්‍රා.ස, බෙලිඅත්ත ප්‍රා.ස, වීරකැටිය ප්‍රා.ස, කටුවන ප්‍රා.ස, ඇහැලියගොඩ ප්‍රා.ස, ඇඹිලිපිටිය ප්‍රා.ස, අරණායක ප්‍රා.ස, රඹුක්කන ප්‍රා.ස, රුවන්වැල්ල ප්‍රා.ස, යටියන්තොට ප්‍රා.ස, මැදවච්චිය ප්‍රා.ස, තිරප්පනේ ප්‍රා.ස, නොච්චියාගම ප්‍රා.ස, හොරොව්පතාන ප්‍රා.ස, ගලෙන්බිඳුනුවැව ප්‍රා.ස, මැදිරිගිරිය ප්‍රා.ස, වැලිකන්ද ප්‍රා.ස, කරෙයිනගර් ප්‍රා.ස, කයිට්ස් ප්‍රා.ස, | 146.32 |

| | | | |
|---|---|---|---|
| | | වාවාකච්චේරි ප්‍රා.ස, මන්නාරම ප්‍රා.ස, වවුනියා න.ස, වවුනියා දකුණ සිංහල ප්‍රා.ස, එරාවුර් න.ස, කොරළේපත්තු උතුර ප්‍රා.ස, එරාවුර්පත්තු - චෙන්කලාඩි ප්‍රා.ස, කොරළේපත්තු බටහිර (ඔඩ්ඩමාවඩි ) ප්‍රා.ස, පෝරතිව්පත්තු ප්‍රා.ස, කෝරළේපත්තු ප්‍රා.ස, නාමල්ඔය ප්‍රා.ස, මහඔය ප්‍රා.ස, පදියතලාව ප්‍රා.ස, අක්කරෙයිපත්තු ප්‍රා.ස, අක්කරෙයිපත්තු ම.න.ස, ත්‍රිකුණාමලය න.ස, ත්‍රිකුණාමලය නගර කඩවත් සතර ප්‍රා.ස, කිනිනියා න.ස, සේරුවාවිල ප්‍රා.ස, යටිනුවර ප්‍රා.ස, යටිනුවර ප්‍රා.ස | |
| 2 | නවතම වර්ගයේ ට්‍රැක්ටරයට සවිකල ජල බවුසර් 02 ක් ලබා දීම. | අක්කරෙයිපත්තු ම.න.ස, අක්කරෙයිපත්තු ප්‍රා.ස, | 3.26 |
| 3 | නවතම වර්ගයේ ඩබල් කැබ්රථ 26 ක් ලබා දීම. | දඹුල්ල ම.න.ස, මාතලේ ම.න.ස, අම්පාර න.ස, කින්නියා න.ස, ගලෙන්බිඳුනුවැව ප්‍රා.ස, බිංගිරිය ප්‍රා.ස, හම්බන්තොට ප්‍රා.ස, අම්බලන්ගොඩ ප්‍රා.ස, මුසලී ප්‍රා.ස, පුත්තලම න.ස, අඹගමුව ප්‍රා.ස, වවුනියා දකුණ (සිංහල) ප්‍රා.ස, දඹුල්ල ප්‍රා.ස, නාමල්ඔය ප්‍රා.ස, පදියතලාව ප්‍රා.ස, යාපනය ම.න.ස, අක්කරෙයිපත්තු ම.න.ස, හම්බන්තොට ප්‍රා.ස, හක්මන ප්‍රා.ස, හපුතලේ ප්‍රා.ස, බලංගොඩ න.ස, පන්නල ප්‍රා.ස, වීරකැටිය ප්‍රා.ස, අතුරලිය ප්‍රා.ස, මහව ප්‍රා.ස, දික්වැල්ල ප්‍රා.ස<br>(මුදල් අමාත්‍යාංශය විසින් වාහන 09 ක් ලබා දී ඇත.) | 53.71 |
| 4 | නවතම වර්ගයේ Standard 350 DI ට්‍රැක්ටරයට සවිකල ගලිබවුසර් 40 ක් ලබා දීම. | ලංකාපුර ප්‍රා.ස, බේරුවල න.ස, බෙන්තොට ප්‍රා.ස, පුත්තලම ප්‍රා.ස, මහියංගන ප්‍රා.ස, හපුතලේ ප්‍රා.ස, නුවරඑළිය ම.න.ස, වත්තල ප්‍රා.ස, අම්බලන්ගොඩ ප්‍රා.ස, සේරුවිල ප්‍රා.ස, මාවනැල්ල ප්‍රා.ස, මහර ප්‍රා.ස, බලපිටිය ප්‍රා.ස, නාවලපිටිය න.ස, පස්ගොඩ ප්‍රා.ස, වෙන්නප්පුව ප්‍රා.ස, හෝමාගම ප්‍රා.ස, රත්නපුර ම.න.ස ,රත්නපුර ප්‍රා.ස,හාලි ඇළ ප්‍රා.ස, අහැළියගොඩ ප්‍රා.ස, කුරුවිට ප්‍රා.ස, අක්කරෙයිපත්තු ම.න.ස, අක්කරෙයිපත්තු ප්‍රා.ස, පොතුවිල් ප්‍රා.ස, හම්බන්තොට ම.න .ස, අම්පාර ම.න.ස, අනුරාධපුර ම.න.ස, මිහින්තලේ ප්‍රා.ස, පාතදුම්බර ප්‍රා.ස, මතුගම ප්‍රා.ස, කල්මුණේ ම.න.ස, පන්නල ප්‍රා.ස, කැස්බෑව න.ස, පඩුවස්නුවර ප්‍රා.ස, කුරුණෑගල ම.න.ස, වාරියපොළ ප්‍රා.ස, පොල්ගහවෙළ ප්‍රා.ස, මාවතගම ප්‍රා.ස, කුළියාපිටිය ප්‍රා.ස | 139.2 |

# 10

# ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති

## (විදේශ අරමුදල් මත ක්‍රියාත්මක)

ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජනපද ආධාර වැඩසටහන, යුරෝපා සංගමය, ජපන් රජය, නෙදර්ලන්ත රජය, සහ ආසියා පදනම, වැනි විදේශ මූල්‍ය ආයතන මගින් ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සහාය දෙනු ලබන අතර පහත සඳහන් විදේශ මූල්‍ය ආයතන සමඟ සහයෝගය හා සම්බන්ධතාවය ගොඩනගා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර, ලබා ගත හැකි ණය ආධාර ප්‍රමාණය විශාල වශයෙන් ඉහළ ගොස් තිබේ. 2013 වසර සඳහාද මෙම ව්‍යාපෘති එලෙසම ක්‍රියාත්මක වේ.

### 10.1 ප්‍රධාන පළාත් සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති

1. පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - (LGIIP) (ආසියානු සංවර්ධන බැංකුව -ADB)
2. “පුර නැගුම” - පළාත් පාලනය නඟාසිටුවීමේ ව්‍යාපෘතිය - Local Government Enhancement Sector Project (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
3. පළාත් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (මධ්‍යම හා සබරගමුව පළාත්) - (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා පදනම - JICA)
4. පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ඌව,නැගෙනහිර,උතුරු පළාත් PRP(Uva,Eastern,Northern Provinces)(ලෝක බැංකුව - WB)
5. නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - ( Eastern & North Central PRP) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
6. උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය Northern Road Connectivity Project) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
7. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - (Greater Colombo Waste Water Management Project) (ආසියානු සංවර්ධන බැංකුව - ADB)
8. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය - (Human Capital Foundation for a Knoweledge Economy – Education Project (ලෝක බැංකුව WB)
9. යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - Jaffna Killinochchi Water Supply Sanitation Projct) (ආසියානු සංවර්ධන බැංකුව ADB)
10. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - (Iranamadu Irrigation Development Project) (IFAD)
11. සෞඛ්‍ය පහසුකම් සහ සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදන ව්‍යාපෘතිය - (JFPR)
12. සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකුව - WB)

## 10.2. පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ග ක්ෂේත්‍රය සඳහා වූ දැවැන්ත සංවර්ධන සහාය

පළාත් මාර්ග සංවර්ධනය යටතේ ආසියානු සංවර්ධන බැංකුව (ADB) ආධාර සපයන පළාත් මාර්ග ව්‍යාපෘතිය මඟින් මේ වන විට නැගෙනහිර පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 163 ක් හා උතුරු මැද පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 220න් 95% ක වැඩ 2013.12.31 දින වන විට නිම කර ඇත.

එසේම ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය මුදල් යටතේ ක්‍රියාත්මක කෙරෙන උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතියේ තෝරාගත් කි.මී. 142න් 86%ක වැඩ මේ වන විට නිම කර ඇත.

ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) ණය මුදල් සපයන පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 164 ක් හා සබරගමුව පළාතේ තෝරාගත් මාර්ග කි.මී. 145න් 46% ක වැඩ මේ වර්ෂය වන විට නිමකර ඇත.

**(අ).ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | ණය ආධාර ලබා දෙන ආයතනය | දිග (කිලෝ මීටර්) |
|---|---|---|
| (අ). නැගෙනහිර හා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධනය කිරීම | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 383 |
| (ආ).පළාත් මාර්ග වැඩිදියුණු කිරීම (නැගෙනහිර, උතුර, ඌව පළාත්) | ලෝක බැංකුව (WB) | 236 |
| (ඇ).පළාත් මාර්ග සංවර්ධනය කිරීම (සබරගමුව, මධ්‍යම පළාත්) | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව (JICA) | 309 |
| (ඇ).උතුරු පළාත් මාර්ග සම්බන්ධිත | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 142 |

# 11

# ව්‍යාපෘති මාලාව

## 11.1 පළාත් පාලන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය(LGIIP)
## *Local Government Infrastructure Improvement Project*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (*ADB*)**

**මූලික අරමුණු :** දිවයිනේ තෝරාගත් පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු සිදු කිරීම තුළින්, එම පළාත් පාලන බල ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ආර්ථික සහ ජීවන තත්වය නංවාලීම සහ පළාත් පාලන ආයතන කාර්යක්ෂම සහ ආකර්ෂණීය පරිපාලන ඒකකයක් වනු පිණිස දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් සහ ශිල්පීමය දැනුමෙන් පිරිපුන් ආයතන බවට පත් කිරීම.

**ව්‍යාපෘති සංරචක :** පළාත් සහ ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම, කාර්යාල ගොඩනැගිලි, පුස්තකාල, ප්‍රජා මධ්‍යස්ථාන වැනි ගොඩනැගිලි ඉදිකිරීම, ආදාහනාගාර ඉදිකිරීම, මාර්ග නඩත්තු උපකරණ සැපයීම සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සැපයීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 6,496
**ව්‍යාපෘති කාලය** : 2006 -2013 ජනවාරි
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 6007
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 92%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 100%

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| 403 | 401.1 | 99.5% |

අදාල ව්‍යාපෘති කාලසීමාව තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කල උප ව්‍යාපෘති 202 ක්ම සාර්ථකව නිම කර ඇත. පහත දැක්වෙන්නේ සාර්ථකව නිමකල ව්‍යාපෘති කිහිපයකි.



පුස්තකාලය -සේවාගම උතුරු මැද පළාත



පුස්තකාලය හා සෞඛ්‍ය මධ්‍යස්ථානය -රඹුක්කන ප්‍රාදේශීය සභාව



පුස්තකාල ගොඩනැගිල්ල - පන්නල ප්‍රාදේශීය සභාව

## 11.2. පුර නැගුම - පළාත් පාලන ආයතන නඟාසිටුවීමේ ව්‍යාපෘතිය
## *( Local Government Enhancement Sector Project)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව *(ADB)***

**මූලික අරමුණු** : පළාත් පාලන ආයතන ක්‍රියාකාරකම් ප්‍රතිනිර්මාණය කිරීම සහ පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ 108 ක් තුළ කුඩා නගර 108 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**ව්‍යාපෘති සංරචක** : මෙය කුඩා නගර දියුණුකිරීමේ වැඩසටහනකි.මෙම ව්‍යාපෘතිය යටතේ සතිපොළවල්, වෙළඳ සංකීර්ණ, ළමා උද්‍යාන, පුස්තකාල, රථගාල්, ගිමන්හල්, සෞඛ්‍ය හා මාතෘ සායන, ප්‍රජා හා තොරතුරු මධ්‍යස්ථාන, ජල ව්‍යාපෘති, සුසාන භූමි, ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිලි ආදිය ඉදි කිරීම කරනු ලැබේ.

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 8940
**ව්‍යාපෘති කාලය** : 2012 - 2015
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 412
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 4.6%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 26%

මෙම ව්‍යාපෘතිය යටතේ දිවයිනේ පසුගාමී පළාත් පාලන ආයතන 108 කට අයත් බල ප්‍රදේශ වල තෝරා ගත් නගර 108 ක් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙන අතර, ක්‍රියාත්මක වන මුළු ව්‍යාපෘති ගණන 190කි.

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| 549 | 387.64 | 71% |

<u>**පුරනැගුම ව්‍යාපෘතියේ විවිධ අවස්ථාවන්**</u>





2013.06.06 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන ආයතන සඳහා ට්‍රැක්ටර් රථ සහ ජල බවුසර් බෙදා දෙන ලද අවස්ථාව



හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - ආරම්භක අවස්ථාව



පළාත් පාලන ආයතන වෙත වාහන බෙදා දීම

## 11.3 .පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය *(Provincial Road Development Project)* මධ්‍යම හා සබරගමුව පළාත්වල *(PRDP - Central & Sabaragamuwa Provinces)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය *(JICA)***

**ව්‍යාපෘති අරමුණු:** පළාත් මාර්ග ( සී සහ ඩී පංතියේ මාර්ග) පුනරුත්ථාපනය කිරීම සහ සේවා තත්ත්වය උසස් කිරීම මඟින් විශ්වසනීය මාර්ග ජාලයක් ඇති කිරීම හා එමඟින් දේශිය ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය සැපයීම හා ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සහ පළාත් සභාවල මාර්ග සම්බන්ධ ආයතනවල සහ මාර්ග කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම යනාදිය වේ.

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 14,212
**ව්‍යාපෘති කාලය** : 2010-2014
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 5843
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 41%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 46%



| ව්‍යාපෘති ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| සබරගමු පළාත | 145 |
| මධ්‍යම පළාත | 164 |
| **එකතුව** | **309** |

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘති ප්‍රදේශ | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සබරගමු පළාත | 1,553 | 1,416 | 91% |
| මධ්‍යම පළාත | 1,360 | 1,358 | 100% |
| සම්බන්ධීකරණ ඒකකය | 569 | 404 | 71% |
| **එකතුව** | **3,482** | **3,178** | **91%** |

**ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්**



**සංවර්ධනය කිරීමට පෙර උඩපුස්සැල්ලාව**
**නිල්දණ්ඩාහින්න - වතුමුල්ල මාර්ගය**
**(නුවරඑළිය දිස්ත්‍රික්කය)**



**සංවර්ධනය කල පසු උඩපුස්සැල්ලාව**
**නිල්දණ්ඩාහින්න - වතුමුල්ල මාර්ගය**
**(නුවරඑළිය දිස්ත්‍රික්කය)**

## *11.4* පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය *(Provincial Road Improvement Project)* ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල *(PRP - Uva, Northern, Eastern Provinces)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ලෝක බැංකුව (WB)**

**මූලික අරමුණු : ඌව, උතුරු සහ නැගෙනහිර පළාත්වල සමාජීය සහ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමෙන්, එම පළාත්වල ස්වයංපෝෂිත ආර්ථික රටාව වැඩිදියුණු කිරීම වේ.**



**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 12,053.75
**ව්‍යාපෘති කාලය** : 2010-2015
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 8,921
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 74%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 87%

| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| ඌව පළාත | 124 |
| නැගෙනහිර පළාත (අම්පාර) | 56 |
| උතුරු පළාත (යාපනය) | 56 |
| **එකතුව** | **236** |

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු. මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | 1,110 | 1,063 | 96% |
| ඌව පළාත | 2,620 | 2,483 | 95% |
| උතුරු පළාත | 760 | 543 | 71% |
| සම්බන්ධීකරණ ඒකකය | 65 | 63 | 97% |
| **එකතුව** | **4,555** | **4,152** | **91%** |

**ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්**




සංවර්ධනය කරන ලද මැදිතලේ- පතනවත්ත-තැන්නේපන්ගුව-කිරිවෙහෙර පාර




සංවර්ධනය වෙමින් පවතින ගලඋඩ-කන්දකැටිය- කරමැටිය පාර

## 11.5. නැගෙනහිර සහ උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතිය
## *( Eastern & North Central Provincial Road Project)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු :** දරිද්‍රතාවයෙන් යුත් සහ යුද්ධයෙන් පීඩිත පළාත් දෙකෙහි මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මඟින් එහි සම්බන්ධතාවන් වැඩි කිරීම සහ උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල පළාත් මාර්ග සංවර්ධන ආයතන ශක්තිමත් කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 8,868.15
**ව්‍යාපෘති කාලය** : 2009 - 2013
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 7,760
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 88%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 97%

| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මි.) |
|---|---|
| නැගෙනහිර පළාත | 163 |
| උතුරු මැද පළාත | 220 |
| **එකතුව** | **383** |



**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | 1,396 | 942 | 67% |
| උතුරු මැද පළාත | 517 | 410 | 79% |
| සම්බන්ධීකරණ ඒකකය | 14.5 | 9.5 | 65% |
| **එකතුව** | **1,927.5** | ***1,361.5*** | ***71%*** |

**ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්**



වවුනතිව් - අත්තියමලෙයි පාර
මඩකලපුව දිස්ත්‍රික්කය



පාන්කුලම් - කිච්ලේකඩ - තිරියායෙයි පාර
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

## 11.6. උතුරු පළාත් මාර්ග සම්බන්ධිත ව්‍යාපෘතිය
### (*Northern Road Connectivity Project)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු :** උතුරු පළාත තුළ වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙකෙහි ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම මඟින් පළාත තුළ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු.මිලියන 2296.95
**ව්‍යාපෘති කාලය** : 2010 - 2015
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 1,956
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 85%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 86%



| ක්‍රියාත්මක ප්‍රදේශ | දිග (කි.මී.) |
|---|---|
| උතුරු පළාත | 142 |
| එකතුව | 142 |

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන(රු. මි.) | වියදම(රු. මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 494.7 | 440.2 | 89% |
| සම්බන්ධීකරණ ඒකකය | 7.9 | 8.3 | 105% |
| එකතුව | 502.6 | 448.5 | 89% |

**ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක්**





තොඩ්ඩාවෙල්ලි - මලුවඩි මාර්ගය සංවර්ධනය කිරීමට පෙර සහ සංවර්ධනය කළ පසු

## 11.7. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
## (*Greater Colombo Waste Water Management Project)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

**මූලික අරමුණු** : කොළඹ සහ දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශ තුළ සහ කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ පවතින අපජල කළමනාකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්** : මේ යටතේ ප්‍රධාන වශයෙන් අපජල පොම්පාගාර 04 ක් ඉදිකිරීම, පොම්පාගාර 07 ක් නවීකරණය කිරීම, පීඩන නළ මාර්ග 02 ක් ඉදිකිරීම , අපජල පද්ධතිය කි.මී. 9 ක් නවීකරණය කිරීම සහ අපජලය මුහුදට බැහැර කරන ප්‍රධාන නල මාර්ග 02 ක් නවීකරණය කිරීම සිදු කෙරේ.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 12,771
**ව්‍යාපෘති කාලය** : 2010 - 2014
**2013.12.31 දිනට මුළු වියදම** : රු.මිලියන 1,391
**2013.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** : 11%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 40%

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 920 | 785 | 85% |
| **එකතුව** | **920** | **785** | **85%** |

**අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ විවිධ අවස්ථාවන්**





## 11.8. දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිණාමනය කිරීමේ ව්‍යාපෘතිය (*Transforming The School Education System as Foundation of a Knowledge Hub Project)*

**ආධාර ලබාදෙනු ලබන ආයතනය : ලෝක බැංකුව *(WB)***

**මූලික අරමුණු** : දැනුම පාදක කරගත් ආර්ථික හා සමාජීය සංවර්ධනයේ පදනම ලෙස ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි වූ ප්‍රවේශය හා එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධන කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 13,000
**ව්‍යාපෘති කාලය** : 2012-2016
**2013.12.31 දිනට මුළු වියදම** : 3,577
**2013.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** : 28%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 32%

| ක්‍රියාත්මක ප්‍රදේශ |
|---|
| සමස්ත දිවයින පුරා |



ද්විතීය පාසැල් 1000 ක සහ ප්‍රාථමික පාසැල් 1500 ක සංවර්ධන කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කරනු ලැබේ. අමාත්‍යාංශය හා පළාත් සභා අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2013 වසරට අදාළ මූල්‍ය ප්‍රගතිය පහතින් දැක්වේ.

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| සම්බන්ධීකරණ ඒකකය | 25 | 24.77 | 99% |
| බස්නාහිර පළාත | 245 | 245 | 100% |
| මධ්‍යම පළාත | 285 | 285 | 100% |
| දකුණු පළාත | 245 | 245 | 100% |
| උතුරු පළාත | 310 | 310 | 100% |
| වයඹ පළාත | 275 | 275 | 100% |
| උතුරු මැද පළාත | 250 | 250 | 100% |
| ඌව පළාත | 295 | 295 | 100% |
| සබරගමුව පළාත | 250 | 250 | 100% |
| නැගෙනහිර පළාත | 340 | 340 | 100% |
| **එකතුව** | ***2,520*** | ***2,519.77*** | ***100%*** |

| පළාත | මහින්දෝදය විද්‍යාගාර ඉදි කිරීම් | | පංති කාමර ඉදි කිරීම් | | කලාප සහ ප්‍රාදේශීය කාර්යාල ඉදි කිරීම් | | අළුත්වැඩියා කටයුතු (පංති කාමර ගොඩනැගිලි සහ කාර්යාල ගොඩනැගිලි) | |
|---|---|---|---|---|---|---|---|---|
| | සැලසුම් කල ප්‍රමාණය | සම්පූර්ණ කර ඇති ප්‍රමාණය | සැලසුම් කල ප්‍රමාණය | සම්පූර්ණ කර ඇති ප්‍රමාණය | සැලසුම් කල ප්‍රමාණය | සම්පූර්ණ කර ඇති ප්‍රමාණය | සැලසුම් කල ප්‍රමාණය | සම්පූර්ණ කර ඇති ප්‍රමාණය |
| බස්නාහිර | 15 | 05 | 02 | 02 | 0 | 0 | 122 | 120 |
| මධ්‍යම | 15 | 15 | 0 | 0 | 06 | 06 | 0 | 0 |
| දකුණ | 15 | 03 | 12 | 12 | 0 | 0 | 32 | 32 |
| උතුරු | 15 | 0 | 17 | 16 | 04 | 0 | 0 | 0 |
| නැගෙනහිර | 15 | 02 | 74 | 53 | 04 | 04 | 20 | 20 |
| වයඹ | 15 | 12 | 17 | 17 | 03 | 0 | 27 | 27 |
| උතුරු මැද | 15 | 06 | 29 | 29 | 0 | 0 | 37 | 37 |
| ඌව | 15 | 14 | 41 | 30 | 10 | 01 | 12 | 12 |
| සබරගමුව | 15 | 05 | 10 | 10 | 0 | 0 | 09 | 09 |
| **එකතුව** | **135** | **62** | **202** | **169** | **27** | **11** | **259** | **257** |



මහින්දෝදය විද්‍යාගාරය ඉදිකිරීමේ අවස්ථාව
ඩී.බී.විජේතුංග ම.විද්‍යාලය, ගෙලිඔය
මධ්‍යම පළාත



දික්කඹුර ප්‍රාථමික පාසල් ගොඩනැගිල්ල
ඉදිකිරීම - දකුණු පළාත

## 11.9.යාපනය හා කිලිනොච්චි ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය Jaffna Killinochchi Water Supply Sanitation Projct

ආධාර ලබාදෙනු ලබන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

**මූලික අරමුණු** : යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම, යාපනය මහ නගර සහා සීමාව තුළ ජනතාව සඳහා සනීපාරක්ෂක යටිතල පහසුකම් හා යාපනය අර්ධද්වීපයේ ජල සැපයුම් කළමනාකරණ වැඩසටහන් ශක්තිමත් කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 2,212.6
**ව්‍යාපෘති කාලය** : 2012-2016
**2013.12.31 දිනට මුළු වියදම** : 33.34
**2013.12.31 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය** : 1.5%

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 320.00 | 23.25 | 7% |
| සම්බන්ධීකරණ ඒකකය | 5.45 | - | - |
| **එකතුව** | ***325.45*** | ***23.25*** | ***7%*** |

## 11.10. ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (Iranamadu Irrigation Development Project)

ආධාර ලබාදෙනු ලබන ආයතනය : කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD)

**මූලික අරමුණු** : වාරිමාර්ග යටිතල පහසුකම් ඵලදායි හා තිරසාර කළමනාකරණයක් සඳහා දියුණු කිරීම හා ජල හා භූමි ඵලදායිතාවය තිරසාර ලෙස දියුණු කිරීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 3300
**ව්‍යාපෘති කාලය** : 2012 – 2017
**2013.12.31 දිනට මුළු වියදම** : 338
**2013.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය** : 10%
**2013.12.31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය** : 15%

| ක්‍රියාත්මක ප්‍රදේශ | වාරි මාර්ග (කි.මී.) |
|---|---|
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 288 |

**2013 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාත්මක ප්‍රදේශ | ප්‍රතිපාදන(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|
| උතුරු පළාත | 475 | 335 | 71% |
| සම්බන්ධීකරණ ඒකකය | 06 | - | - |
| එකතුව | 481 | 335 | 70% |



පරන්තන් ප්‍රධාන ඇළ මාර්ගයේ පාලම ඉදි කිරීම





පරන්තන් ප්‍රධාන ඇළ මාර්ගයේ අතුරු ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

## *11.11.* උතුරු මැද පළාතේ දිළිඳු ජන කොටස් සඳහා සෞඛ්‍ය පහසුකම් සහ සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදන ව්‍යාපෘතිය(*JFPR*)

**ආධාර ලබාදෙනු ලබන ආයතනය :** දිළිඳුබව අවම කිරීම සඳහා වන ජපන් අරමුදල

**මූලික අරමුණු :** භූගත පානීය ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නව ක්‍රම හඳුන්වා දීම, ප්‍රජා ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතන මඟින් ප්‍රජා සංවිධාන වෙත සහයෝගය ලබාදීම සහ ජලය හේතුවෙන් හට ගන්නා දීර්ඝ කාලීන රෝග වැළැක්වීම.

**ව්‍යාපෘති පිරිවැය :** රු. මිලියන 400
**ව්‍යාපෘති කාලය :** 2013 - 2015

| ක්‍රියාත්මක ප්‍රදේශ |
|---|
| උතුරු මැද (අනුරාධපුරය-කැබිතිගොල්ලෑව, මැදවච්චිය, පොළොන්නරුව - මැදිරිගිරිය, දිඹුලාගල) |

මෙම ව්‍යාපෘතියේ මූලික අදියරේ වැඩ කටයුතු සිදු කරමින් පවතී.

## 11.12. ද්විතියික සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය

**ආධාර ලබාදෙනු ලබන ආයතනය :** ලෝක බැංකුව

**මූලික අරමුණු** : පෝෂණය සහ බෝ නොවන රෝග සම්බන්ධයෙන් පැන නඟින අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පහසුකම් නංවාලීම.

**ව්‍යාපෘති පිරිවැය** : රු. මිලියන 26,000
**ව්‍යාපෘති කාලය** : 2013-2016
**සමස්ථ භෞතික ප්‍රගතිය** : 10%

| ක්‍රියාත්මක ප්‍රදේශ |
|---|
| සමස්ත දිවයින පුරා |

# 12

# පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

## 12.1. හැඳින්වීම

- පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ පනත යටතේ පිහිටුවන ලදී.
- මෙම ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලබලයෙන් සාමාජිකයන් 8ක් සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විතය.
- මෙම ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදු කරනු ලැබේ.

### දැක්ම

කළමනාකරණ, උපදේශන, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙහි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ සහ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණුකිරීමේ එකම ආයතනය බවට පත්වෙමින් එමගින් මහජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට උරදීමයි.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රීලංකා ආයතනය පහත සඳහන් අංශවලින් සමන්විතය,

1. **ඉංජිනේරු අංශය**
2. **මූල්‍ය කළමනාකරණ අංශය**
3. **පොදු කළමනාකරණ අංශය**
4. **පර්යේෂණ අංශය**
5. **මානව සම්පත් සංවර්ධන අංශය**
6. **භෞතික සැලසුම් අංශය**
7. **නීති අංශය**

## අරමුණු

- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන්හි සහභාගීත්වය ඇතිව පළාත් පාලනය හා සම්බන්ධ ආයතනයන්හි ආයතනික ශක්තිය වැඩිදියුණු කරලීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කරලීම පිණිස පළාත් කළමනාකරණ සහ පුහුණු ඒකක ශක්තිමත් කිරීම.
- පළාත් පාලනයේ සියලු පාර්ශවකරුවන්ට තාක්ෂණ හා තොරතුරු සේවා සපයමින් ජාතික සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- අදාල ජාතික හා අන්තර් ජාතික ආයතන සමග සබඳතා පවත්වා ගනිමින් පළාත් පාලනයේ කේන්ද්‍රීය ස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ ආයතනික කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධව විශේෂඥ සේවා සැපයීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි නෛතික කරුණු සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම.
- පළාත් පාලන සහ පළාත් සභා ආයතනවලට අදාල දත්ත හා තොරතුරු එක්රැස් කිරීම සහ එම තොරතුරු පවත්වාගෙන යාම.

## මෙහෙවර

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙවර වනුයේ කළමනාකරණය, උපදේශනය, පර්යේෂණ සහ පුහුණු කිරීම් මගින් පළාත් පාලන සහ පළාත් සභා ආයතනයන්හි කළමනාකරණ, මූල්‍ය කළමනාකරණ හා තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමයි. ඒ සඳහා පහත සඳහන් කාර්යයන් මෙම ආයතනය විසින් ඉටුකරනු ලබයි.

- පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයන් උපයෝගි කර ගනිමින් පළාත් සභාවන්හි සහ පළාත් පාලන ආයතනයන්හි හැකියා වර්ධනය කිරීම සඳහා සැලසුම් සකස්කොට ක්‍රියාත්මක කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනය ශක්තිමත් කිරීම සඳහා උපදේශනය, පුහුණු සහ පර්යේෂණ සේවා ලබාදීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළාත් පාලනයට සම්බන්ධිත ආයතන සමග අන්තර් සබඳතා ගොඩනගා ගනිමින් පළාත් පාලනය පෝෂණය කිරීම.
- පළාත් පාලන ව්‍යුහය සඳහා තාක්ෂණික තොරතුරු සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන කාර්යක්ෂම කරවීමට අදාල වන ආධාරක සහ පුහුණු හා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

## 12.2. 2013 වර්ෂයේ සැලසුම් කල වැඩසටහන්

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පුහුණු වැඩමුළු, සම්මන්ත්‍රණ හා ප්‍රායෝගික සැසි යනාදී වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම පළාත් පාලන පුවත් ඇතුලත් පළාත් පාලන පුවත්පත සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කෙරේ.


### (අ) 2013 වර්ෂය සඳහා සැලසුම් කල වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| අංශය | කාර්යය | වර්ෂය තුල පැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව | අපේක්ෂිත වියදම (රු.මි) | සත්‍ය වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය | අපේක්ෂිත පුහුණුලාභීන් සංඛ්‍යාව/ වැඩමුළු | සත්‍ය පුහුණු ලාභීන් සංඛ්‍යාව / වැඩමුළු | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු | දැනුවත් කිරීමේ වැඩමුළු | 33 | 4.4 | 3.1 | 70% | 1962 | 1941 | 99% |
| මූල්‍ය කළමනාකරණ | පුහුණු වැඩමුළු සහ පාඨමාලා | 02 | 2.00 | 2.34 | 111% | 550 | 654 | 118% |
| | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වැඩමුළු | 01 | 0.14 | 0.08 | 57% | 02 | 01 | 50% |
| නීති අංශය | දැනුවත්කිරීමේ වැඩමුළු | 20 | 2.08 | 2.37 | 114% | 1000 | 1336 | 133% |
| භෞතික සැළසුම් අංශය | දැනුවත්කිරීමේ වැඩමුළු | 11 | 1.68 | 1.92 | 114% | 460 | 734 | 159% |
| පොදු කළමනාකරණ | දැනුවත්කිරීමේ වැඩමුළු | 15 | 1.32 | 1.66 | 125% | 600 | 903 | 150 |
| පර්යේෂණ | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පර්යේෂණ කාර්යයන් පාඨමාලා | 01 | 0.41 | 0.21 | 51% | 40 | 35 | 87% |
| | අනෙකුත් පර්යේෂණ හා වැඩමුළු | 04 | 2.22 | 1.76 | 79% | - | - | - |
| එකතුව | | **87** | **14.25** | **13.44** | | **4,614** | **5,604** | |

අංශ අනුව අපේක්ෂිත හා සත්‍ය වියදම වශයෙන් බෙදී ගොස් ඇති ආකාරය වගු අංක 05 න් හා ප්‍රස්ථාර අංක 0 5න් දැක්වේ.

| අංශය | සත්‍ය වියදම (රු.මි) | අපේක්ෂිත වියදම (රු.මි) |
|---|---:|---:|
| ඉංජිනේරු | 3.1 | 4.4 |
| මූල්‍ය කළමනාකරණ | 2.42 | 2.14 |
| නීති අංශය | 2.37 | 2.08 |
| භෞතික සැළසුම් අංශය | 1.92 | 1.68 |
| පොදු කළමනාකරණ | 1.66 | 1.32 |
| පර්යේෂණ | 1.97 | 2.63 |
| **මුළු වියදම** | **13.44** | **14.25** |

වගු අංක **05**




ප්‍රස්ථාර අංක **05**

13

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## දැක්ම

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම.

## මෙහෙවර

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් තිරසාර සහ ස්වාධීන මූල්‍ය ආයතනයක් තුළින් ලබා දී රටේ සමාජ සහ ආර්ථික වර්ධනයට දායකවීම.

## කාර්යභාරය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 1916 අංක 22 දරණ ආඥා පනතින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට අයත්වන අතර පනත ක්‍රියාත්මක කිරීමේ බලතල පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය සතුය. දිවයිනේ පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය අරමුදල් සහන ණය ක්‍රමයක් යටතේ සපයනු ලබන එකම රාජ්‍ය ආයතනයයි.

### 13.1 පළාත් පාලන ආයතන වෙත ණය මුදල් නිකුත් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති පහත දැක්වේ.

01. ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම සහ සතිපොළ නවීකරණය කිරීම
02. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
03. ආදාහනාගාර ඉදිකිරීම
04. මාර්ග ඉදිකිරීමේ යන්ත්‍ර සූත්‍ර සහ කසළ අපහරණය සඳහා ට්‍රැක්ටර් මිලදීගැනීම
05. පොදු වෙළඳපළ ඉදිකිරීම
06. කාර්යාල ගොඩනැගිලි සහ පුස්තකාල ඉදිකිරීම
07. මාර්ග සංවර්ධන ව්‍යාපෘති
08. පානීය ජල සැපයුම් ව්‍යාපෘති
09. වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති

# අරමුදල්

ණය මුදල් සැපයීම සඳහා අවශ්‍ය අරමුදල්, සහන පොළී පදනමක් මත වසර 25 කින් ආපසු ගෙවිය යුතු පදනම මත ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලැබේ.

මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත පළාත් පාලන ආයතන සඳහා නිකුත් කළ ණය මුදල් ආපසු අයකර මහා භාණ්ඩාගාරය වෙත ගෙවීමේ වගකීමද දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇති අතර, එම අරමුදල් පළාත් පාලන ආයතන වෙත ණය වශයෙන් නිකුත් කිරීම සඳහා චක්‍රීය කිරීමේ පහසුකම්ද සලසා ඇත.

## 13.2. 2013 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන්

2013 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මිලියන 300 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 33 සඳහා රු.මි. 225.48 ක් නිකුත් කර තිබුණි.

**(අ) වර්ෂය තුලදී ව්‍යාපෘති අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය දැක්වෙන සාරාංශය පහත පරිදි වේ.**

| අනු අංකය | ව්‍යාපෘති වර්ගය | මුදල (රු.මිලියන) | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|
| i | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 197.86 | 25 |
| ii | ආදාහනාගාර ඉදි කිරීම | 1.98 | 01 |
| iii | සතිපොළ හා ආර්ථික මධ්‍යස්ථාන ඉදි කිරීම | 10.65 | 04 |
| iv | පොදු වෙළඳපොල ගොඩනැගිලි ඉදි කිරීම | 14.99 | 03 |
| **එකතුව** | | **225.48** | **33** |

**(ආ) ණය නිකුත් කිරීමේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.**

| | | | | |
|---|---|---|---|---|
| i | මූල්‍ය ප්‍රගතිය | **අපේක්ෂිත වියදම (රු.මිලියන)** | **සත්‍ය වියදම (රු.මිලියන)** | **මූල්‍ය ප්‍රගතිය %** |
| | | 300 | 225.48 | 75.16 |
| ii | භෞතික ප්‍රගතිය | අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව | සත්‍ය ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය |
| | | 44 | 33 | 75 |

**(ඇ) වාරික හා පොළී අයකිරීම් වශයෙන් වෙන් වෙන්ව ණය අයකර ගැනීමේ ප්‍රගතිය 2013**

| | ණය වර්ගය | වාරික (රු.මිලියන) | පොලී අය කිරීම් (රු.මිලියන) | එකතුව (රු.මිලියන) |
|---|---|---|---|---|
| **i** | දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නිකුත් කල ණය (LLDF) | 54.39 | 124.09 | 178.48 |
| **ii** | බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කල ණය මුදල් (PCDP) | 1.37 | 7.43 | 8.79 |
| **iii** | නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 82.46 | 90.35 | 172.81 |
| **iv** | පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) | 86.16 | 170.48 | 256.64 |
| **එකතුව** | | **224.38** | **392.35** | ***616.72*** |


**(ඇ) පසුගිය වර්ෂ 06ක මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.**

| වර්ෂය | වාරික (රු.මිලියන) | | | | පොළිය (රු.මිලියන) | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | LLDF | PCDP | UDLIHP | LGIIP | LLDF | PCDP | UDLIHP | LGIIP | (රු.මිලියන) |
| 2008 | 21.5 | - | 10.7 | - | 27.0 | 6.0 | 85.4 | - | 150.6 |
| 2009 | 21.5 | 0.34 | 56.2 | - | 25.7 | 7.6 | 73.3 | - | 184.64 |
| 2010 | 22.9 | 0.17 | 56.2 | - | 25.1 | 6.0 | 67.2 | - | 177.57 |
| 2011 | 22.9 | 1.15 | 56.2 | - | 23.5 | 6.0 | 67.2 | 34.7 | 211.65 |
| 2012 | 22.9 | 1.26 | 109.6 | - | 21.8 | 7.6 | 90.8 | 29.0 | 282.96 |
| 2013 | 22.8 | 1.02 | 90.55 | - | 20.37 | 5.87 | 99.0 | 35.65 | 275.26 |
| **එකතුව** | **134.5** | **3.94** | **379.45** | - | **143.47** | **39.07** | **482.9** | **99.35** | **1282.68** |

**(ඉ) 2013 වර්ෂයේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය වගු අංක 06 න් හා ප්‍රස්ථාර අංක 06 න් දැක්වේ.**

| ණය වර්ගය | ණය වාරික හා පොලී ලැබීම් (රු.මිලියන) |
|---|---|
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නිකුත් කල ණය (LLDF) | 178.48 |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කල ණය මුදල් (PCDP) | 8.79 |
| නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 172.81 |
| පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) | 256.64 |
| එකතුව | **616.72** |

වගු අංක 06





ප්‍රස්ථාර අංක 06

**(ඊ) නිකුත් කරන ලද ණය වර්ග අනුව මහා භාණ්ඩාගාරය වෙත වාරිකය හා පොළිය ආපසු ගෙවීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වගු අංක 07 න් හා ප්‍රස්ථාර අංක 07 න් පෙන්නුම් කෙරේ.**

| **වර්ෂය** | **ණය වාරික හා පොළිය (රුපියල් මිලියන වලින්)** | | | |
|---|---|---|---|---|
| | දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) | බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) | නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) |
| 2008 | 48.50 | 6.00 | 96.10 | - |
| 2009 | 47.20 | 7.94 | 129.50 | - |
| 2010 | 48.00 | 6.17 | 123.40 | - |
| 2011 | 46.40 | 7.15 | 123.40 | 34.70 |
| 2012 | 44.70 | 8.86 | 200.40 | 29.00 |
| 2013 | 43.17 | 6.89 | 189.55 | 35.65 |
| **එකතුව** | **277.97** | **43.01** | **862.35** | **99.35** |

වගු අංක 07




ප්‍රස්ථාර අංක 07